٢١٩

# ඉස්ලාම් නීතිරීතීන් හා සාරධර්ම

# أحكام وآداب إسلامية




The Cooperative Office For Call & Guidance to Communities at Rawdhah Area
Under the Supervision of Ministry of Islamic Affairs and Endowment
and Call and Guidance -Riyadh - Rawdhah
Tel. 2492727 - fax.2401175 E.mail: mrawdhah@hotmail.com P.O.Box 87299 Riyadh 11642

# أحكام وآداب إسلامية

## أعده وترجمه للغة السنهالية

## شعبة توعية الجاليات بالزلفي

**الطبعة الأولى: ١٤٢١/٣**


ⓒ شعبة توعية الجاليات بالزلفي ، ١٤٢١هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

شعبة توعية الجاليات بالزلفي

أحكام وآداب إسلامية - الزلفي .

٦٨ ص ؛ ١٢ × ١٧ سم

ردمك : X - ٨٦ - ٨١٣ - ٩٩٦٠

(النص باللغة السنهالية)

١ - الاخلاق الإسلامية　　　أ- العنوان

ديوي ٢١٢,٣　　　٢١/١٤٤٦

رقم الايداع ٢١/١٤٤٦

ردمك : X - ٨٦ - ٨١٣ - ٩٩٦٠

الصف والإخراج: **شعبة توعية الجاليات بالزلفي**

# පටුන


| අනු අංක | විෂය | පිටු අංක |
|---|---|---|
| 1 | නිශ්කලංකය හා බිය භක්තිය | 5 |
| 2 | ෂිර්කය හා තවුහීදය | 7 |
| 3 | මූනිච්චාවෙහි බාධාවන් | 11 |
| 4 | ප්‍රාර්ථනාව | 13 |
| 5 | අධ්‍යාපනය | 16 |
| 6 | අණකිරීම හා වළක්වාලීම | 19 |
| 7 | අණකිරීම් හා වළක්වාලීම්හි පිළිවෙල් | 21 |
| 8 | දෙමාපියන්ට උපකාර කිරීම | 23 |
| 9 | යහපත් ගුණාංග | 26 |
| 10 | සිහිඳුකම හා සැනසුම | 28 |
| 11 | කරුණාව | 30 |
| 12 | අපරාධ නොකිරීම | 31 |
| 13 | මුස්ලිම්වරයාගේ ජීවිතයෙහි වගකීම | 33 |
| 14 | මුස්ලිම්වරයාගේ වගකීම | 34 |
| 15 | අසල්වාසීන් පිළිබඳ වගකීම | 37 |
| 16 | දිවෙහි අනර්ථය | 38 |
| 17 | කේළාම් කීමෙන් වැළකීම | 40 |
| 18 | සත්‍යය හා අසත්‍යය | 43 |
| 19 | පාප ප්‍රහාණය | 46 |
| 20 | සලාමය පැතිරවීම | 48 |
| 21 | ආහාර අනුභව කිරීමේ පිළිවෙල් | 51 |
| 22 | මලමූත්‍රා පහකිරීම | 53 |
| 23 | කිඹිසීම හා ඇනුම | 54 |
| 24 | බල්ලන් ඇතිකිරීම | 57 |
| 25 | අල්ලාහ් සිහි කිරීම | 58 |
| 26 | මිත්‍රයා | 62 |
| 27 | ඉවසීම | 64 |

# أحكام وآداب إسلامية

# ඉස්ලාම් නීතිරීතීන් හා සාරධර්ම

## 1-නිශ්කලංකය හා දේව භක්තිය

අල්ලාහ් වෙනුවෙන් යනු නිශ්කලංකය හා ඔහු තමන් කරා අවධානය යොමුකරමින් සිටී යනු දේව භක්තිය පිළිබඳව පහත සඳහන් පරිදි අල්ලාහ් තආලා පවසන්නේය.

﴿وَمَا أُمِرُوْا إِلاَّ لِيَعْبُدُوااللهَ مُخْلِصِيْنَ لَهُ الدِّيْنَ﴾ [البينة :٥]

තවද, මවුන් තම ආගම නිශ්කලංකයෙන් අල්ලාහ්ට පමණක් උරුමකරමින් ඔහුට (අවනතවී) වැඳුම් පිදුම් කළ යුතු බව මවුන්ට අණ කරන ලදී. *(අල්කුර්ආන්-98:5)*

﴿قُلِ اللهَ اَعْبُدُ مُخْلِصًا لَّهُ دِيْنِيْ﴾ [الزمر :١٤]

(නබිතුමනි) ඔබ පවසන්න, 'මාගේ ධහමෙහි මා අල්ලාහ්ව නිශ්කලංකයෙන් අදහන්නෙමි'. *(අල්කුර්ආන්-39:14)*

﴿قُلْ إِنْ تُخْفُوْا مَا فِيْ صُدُوْرِكُمْ أَوْ تُبْدُوْهُ يَعْلَمْهُ اللهُ﴾ [آل عمران :٢٩]

(නබිතුමනි) 'ඔබ සිතෙහි ඇති දේ ඔබ සැඟවුවද හෝ ප්‍රසිද්ධ කළද ඒවා අල්ලාහ් දැන සිටින' බව පවසන්න. *(අල්කුර්ආන්-3:29)*

﴿إِنَّ اللهَ لاَ يَخْفَى عَلَيْهِ شَيْءٌ فِي الْأَرْضِ وَلاَ فِي السَّمَاءِ﴾ [آل عمران :٥]

අහසෙහි හා පොළොවෙහි ඇති කිසිඳු දෙයක් හෝ අල්ලාහ්ට සැඟවී නොමැත. *(අල්කුර්ආන්-3:5)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව උමර් බින් කත්තාබ් (රලි) තුමා මෙසේ පවසන්නේය.

[إِنَّمَا الأَعْمَالُ بِالنِّيَّاتِ وَإِنَّمَا لِكُلِّ امْرِءٍ مَا نَوَى...] (متفق عليه)

නිසැකයෙන්ම, ක්‍රියාවන් සියල්ල සිතුවිල්ල මත සිදුවේ. නියත වශයෙන්ම, සෑම මිනිසෙකුටම ඔවුනොවුන්ගේ සිතුවිල්ල මතම පල ලැබෙන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)* මුහම්මදු නබි (සල්) තුමා පැවැසූ බව අබූ හුරෛරා (රලි) තුමා මෙසේ පවසන්නේය.

[أَسْعَدُ النَّاسِ بِشَفَاعَتِيْ يَوْمَ الْقِيَامَةِ مَنْ قَالَ لاَ إِلَهَ إِلاَّ اللهُ خَالِصًا مِنْ قَلْبِهِ]

(رواه البخاري)

කවරෙකු තම සිතෙහි නිශ්කලංකයෙන් ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් පවසන්නේද, පරලොවෙහි මාගේ නිර්දේශයට මිනිසුන් අතර ඉමහත් භාග්‍යවන්තයා ඔහුය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

[إِنَّ اللهَ لاَ يَنْظُرُ إِلَى صُوَرِكُمْ وَأَمْوَالِكُمْ، وَلَكِنْ يَنْظُرُ إِلَى قُلُوْبِكُمْ وَأَعْمَالِكُمْ]

(رواه مسلم)

නිසැකයෙන්ම, අල්ලාහ් ඔබලාගේ ශරීරය හා ඔබලාගේ ධනය කෙරෙහි අවධානය යොමු නොකරයි. නමුත්, ඔහු ඔබලාගේ සිත් හා ක්‍රියාවන් කෙරෙහි අවධානය යොමු කරයි. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)* මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූදර් (රලි) තුමා මෙසේ පවසන්නේය.

[اتَّقِ اللهَ حَيْثُ مَا كُنْتَ وَأَتْبِعِ السَّيِّئَةَ الْحَسَنَةَ تَمْحُهَا وَخَالِقِ النَّاسَ بِخُلُقٍ حَسَنٍ]

(رواه الترمذي)

ඔබ කුමන තැනක සිටියද අල්ලාහ්ට බියවන්න. අකුසල් ක්‍රියාවක් සිදුවූ විගස කුසල් ක්‍රියාවක් ඉටුකරන්න. එය (කුසල් ක්‍රියාව) අකුසල් ක්‍රියාවන් විනාශ කරයි. ඔබ මිනිසුන් අතරෙහි යහපත් ගුණාංගයෙන් හැසිරෙන්න. *(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1- නියතවශයෙන්ම, චිත්ත පාරිශුද්ධිය අල්ලාහ්ගෙන් කුලිය වැඩි කර ගැනීමට අවශ්‍යවන සේ, ක්‍රියාවන් පිළිගැනීමටද එක්තරා කොන්දේසියෙකි.

2- නියත වශයෙන්ම, අල්ලාහ් සමාන කිරීමෙන් උවමනා නොවන්නාය. ඔහුට වෙනුවෙන් යනු චින්ත පාරිශුද්ධියෙන් තොරව කරන කාර්‍යයන් ඔහු පිළි නොගන්නේය. හදීස් කුදුස්හි අල්ලාහ් පැවැසූ බව මෙසේ වාර්තාවේ.

[من عمل عملا أشرك فيه معي غيري تركته وشركه]

කවරෙකු හෝ කිසියම් කාර්‍යයෙහි යෙදී සිට එහි මා සමග මා හැර අන් දෙයක් සමාන කරන්නේද, මා ඔහුව හා ඔහු සමාන කළ දේ (එසේම) අත් හරින්නෙමි.

3- අහසේ හා පොළොවෙහි ඇති කිසියම් දෙයක් හෝ අල්ලාහ් ඉදිරියේ සැඟවී නොමැත. යන චේතනාව අනුව සෑම අවස්ථාවන්හිම අල්ලාහ්ට බියවීම අනිවාර්‍යවේ.

# 2-ෂිර්කය හා තව්හීදය

ෂිර්කය (අල්ලාහ්ට සමාන කිරීම) හා තව්හීදය (ඒකදේවත්වය) පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ إن الشرك لظلم عظيم ﴾ [لقمن :١٣]

නිසැකයෙන්ම, සමාන (ෂිර්ක්) කිරීම ඉමහත් අපරාධයෙකි. *(අල්කුර්ආන් 31:13)*

﴿ إِنَّ اللهَ لاَ يَغْفِرُ أَنْ يُّشْرَكَ بِهِ وَيَغْفِرُ مَا دُوْنَ ذَالِكَ لِمَنْ يَّشَاءُ﴾ [النساء :٤٨]

නිසැකයෙන්ම අල්ලාහ් තමාට සමාන කිරීමට සමාව නොදෙන්නේය. මෙය හැර (අන්) සියල්ල සඳහා තමා කැමැති අයට සමාව ලබා දෙන්නේය. *(අල්කුර්ආන් 4:48)*

﴿ وَلَقَدْ أُوْحِيَ إِلَيْكَ وَإِلَى الَّذِيْنَ مِنْ قَبْلِكَ لَئِنْ أَشْرَكْتَ لَيَحْبَطَنَّ عَمَلُكَ وَلَتَكُوْنَنَّ مِنَ الْخَاسِرِيْنَ ﴾ [الزمر :٦٥]

තවද, (නබිතුමනි) 'ඔබ (අල්ලාහ්ට) ෂිර්ක් (සමාන) කිරීමෙහි යෙදෙන්නේනම්, ඔබගේ ක්‍රියාවන් සියල්ල විනාශවේ. ඔබ අලාභ කරුවන්ගෙන් කෙනෙකු ලෙසට පත්වේ' යනුවෙන් ඔබටත් ඔබට පෙර සිටි අයටත් වහී (දේව පණිවිඩ) මගින් පවසන ලද්දේය. *(අල්කුර්ආන්-39:65)*

﴿وَمَا خَلَقْتُ الْجِنَّ وَالْإِنْسَ إِلاَّ لِيَعْبُدُوْنَ﴾ [الذاريات :٥٦]

තවද, ජින් හා මිනිස් වර්ගයන්, මාහට ඉබාදත් (සම්පූර්ණයෙන් අවනතවී මාගේ අණ පිළිගෙන ජීවත්වීමට හා මාහට පමණක් වැඳුම් පිදුම්) කිරීමට හැර මා මැවුයේ නැත. *(අල්කුර්ආන් 51:56)*

﴿وَلَقَدْ بَعَثْنَا فِيْ كُلِّ أُمَّةٍ رَّسُوْلاً أَنِ اعْبُدُوا اللهَ وَاجْتَنِبُوا الطَّاغُوْتَ﴾ [النحل:٣٦]

'නිසැකයෙන්ම, ඔබ අල්ලාහ්ටම වැඳුම් පිදුම් කරන්න. තාගූත් (අසත්‍ය දෙවි)වරුන් ගෙන් වැළකී සිටින්න'. යනුවෙන් දේශනා

කිරීම සඳහා අපි සෑම සමාජයක් කරාම රසූල්වරුන් (දූතවරුන්) එව්වෙමු. *(අල්කුර්ආන් 16:36)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ජාබිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[مَنْ لَقِيَ اللهَ لاَ يُشْرِكُ بِهِ شَيْئًا دَخَلَ الْجَنَّةَ وَمَنْ لَقِيَهُ يُشْرِكُ بِهِ شَيْئًا دَخَلَ النَّارَ]

(رواه مسلم)

කවරෙකු අල්ලාහ්ට කිසියම් දෙයක් මගින් හෝ ෂිර්ක් (සමාන) නොකර අල්ලාහ්ව බැහ දකින්නේද, ඔහු ස්වර්ගයට පිවිසේ. කවරෙකු අල්ලාහ්ට කිසියම් දෙයක් මගින් හෝ ෂිර්ක් කරමින් ඔහුව බැහ දකින්නේද, ඔහු නිරයට පිවිසේ. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෙයිරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[اِجْتَنِبُوْا السَّبْعَ الْمُوْبِقَاتِ، قَالُوْا يَا رَسُوْلَ اللهِ وَمَا هُنَّ ؟ قَالَ الشِّرْكُ بِاللهِ...]

(متفق عليه)

'විනාශය ගෙනදෙන කරුණු හතක් කෙරෙහි වැළකී සිටින්න' යනුවෙන් නබි තුමා පැවැසූ විට සහාබාවරුන්, නබිතුමනි, ඒවා කුමක්ද? යනුවෙන් ඇසූහ. එවිට එතුමා 'අල්ලාහ්ට සමාන කිරීම, යනුවෙන් පැවැසීය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව මුආද් බින් ජබල් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

كُنْتُ رَدِيْفَ النَّبِيِّ ﷺ عَلَى حِمَارٍ فَقَالَ:[يَا مُعَاذُ، أَتَدْرِيْ مَا حَقُّ اللهِ عَلَى الْعِبَادِ وَمَا حَقُّ الْعِبَادِ عَلَى اللهِ ؟ قُلْتُ اللهُ وَرَسُوْلُهُ أَعْلَمْ. قَالَ :حَقُّ اللهِ عَلَى

الْعِبَادِ أَنْ يَعْبُدُوهُ وَلاَ يُشْرِكُوا بِهِ شَيْئًا، وَحَقُّ الْعِبَادِ عَلَى اللهِ أَلاَّ يُعَذِّبَ مَنْ لاَ يُشْرِكُ بِهِ شَيْئًا...] (رواه البخاري ومسلم)

මා, බූරුවා මත නබිතුමාගේ පිටුපසෙහි (අසුන්ගෙන) සිටියදී එතුමා, 'මුආද්, දාසයන් අල්ලාහ්ට කළයුතු හා අල්ලාහ් දාසයන්ට කළයුතු වගකීම් කුමක් බව ඔබ දැන සිටින්නේද' යනුවෙන් ඇසීය. මෙවා අල්ලාහ් හා ඔහුගේ රසූල්වරයා පමණක් ඉතා දැන සිටින්නාය යනුවෙන් පැවැසුවෙමි. එවිට එතුමා, 'දාසයන් අල්ලාහ්ට කළයුතු වගකීම් 'ඔවුන් ඔහුට (පමණක්) වැඳුම් පිඳුම් කළයුතු අතර කිසියම් දෙයක් හෝ ඔහුට සමාන නොකිරීමකි'. අල්ලාහ් දාසයන්ට කළ යුතු වගකීම් 'ඔහුට කිසියම් දෙයක් හෝ සමාන නොකරන්නන්ට වේදනා (දඬුවම්) නොකිරීමකි' යනුවෙන් පැවසීය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1- ෂිර්ක් (සමාන) කිරීම අනතුරුදායකය. නිසැකයෙන්ම අල්ලාහ් ෂිර්කයට තව්බා (පාප ප්‍රහාණය) කිරීමෙන් තොරව සමාව නොදෙන්නේය. මෙය අල්ලාහ්ගේ (සමාව දීමේ) කැමැත්තට අයත්වන වෙනත් පාපයන් සේ නොවන්නේය.

2- කවරෙකු ෂිර්ක් (සමාන) කිරීමෙහි සිටියෙදී මරණයට පත්වන්නේද, නිශ්චයෙන්ම ඔහුගේ (කුසල්) ක්‍රියාවන් විනාශවේ. ඔහු අපායයෙහි ස්ථිරව සිටීමටද මෙය හේතුවේ.

3- ඒකදේවත්වය (තව්හීද්) මිනිස් හා ජින් වර්ගයන් මැවීමට ප්‍රථම කාරණය වන බැවින් ඒකදේවත්වය ශ්‍රේෂ්ඨයෙන් පවතී. ස්වර්ගයෙහි පිවිසීමට හා අපායයෙන් නිදහස්වීමට අයත් හේතුන් අතර උතුම් හේතුවක් වන්නේද මෙයමය.

# 3-මුණිච්චාවෙහි බාධාවන්

මෙම කරුණ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿فويل للمصلين، الذين هم عن صلاتهم ساهون، الذين هم يرآءون، ويمنعون الماعون﴾ [الماعون: ٤-٧]

තවද, (නොසැළකිල්ලෙන්) සලාතය ඉටු කරන්නන්ට විපත හිමිවේ. ඔවුන් තම සලාතය ගැන සැළකීමක් නොදක්වති. ඔවුන් අන් අයට (තම සලාතය) පෙන්වති. තවද, සාමාන්‍ය අවශ්‍යතාවට අයත් දේද (මිනිසුන්ට) ලබාදීම වළක්වති. *(අල්කුර්ආන්-107: 4,5,6,7)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන්දුන් බව අබූ සර්ද් බින් ෆළාලා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

(سمعت رسول الله ﷺ يقول [إذا جمع الله الأولين والآخرين ليوم القيامة ليوم لا ريب فيه نادى مناد : من كان أشرك في عمله لله أحدا فليطلب ثوابه من عنده، فإن الله أغنى الشركاء عن الشرك] (رواه الترمذي)

කිසිදු සැකයත් නොමැති දිනයවූ පරලොව දිනයෙහි අල්ලාහ් පැරැන්නන් හා පසු විසූ අය එක්කරන අවස්ථාවේ දැනුම් දෙන් නෙක් 'කවරෙකු තම ක්‍රියාවන්හි අල්ලාහ්ට කිසියම් කෙනෙක් සමාන කළේද, ඔහු එහි කුලිය ඔහුගෙන් ලබාගත යුතුයි. මක් නිසාදයත්, අල්ලාහ් සමාන කරුවන්ගේ සමාන කිරීමෙන් උවමනා නොවන්නාය' යනුවෙන් දැනුම් දෙයි. *(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

අබූ සර්ද් අල් කුද්රි (රලි) තුමා මෙසේ පවසන්නේය.

خرج علينا رسول الله ﷺ ونحن نتذاكر المسيح الدجال فقال: [ ألا أخبركم بما هو أخوف عليكم عندي من المسيح الدجال؟ فقلنا بلى يا رسول الله! فقال: الشرك الخفي، أن يقوم الرجل يصلي فيزين صلاته لما يرى من نظر الرجل إليه ] (رواه إبن ماجة)

අපි මසීහ් දජ්ජාල් පිළිබඳව සාකච්ඡා කරමින් සිටිනවිට නබි මුහම්මදු (සල්) තුමා අප වෙත පැමිණ, මසීහුද් දජ්ජාල්ට වඩා මබ අතරහි මා දැඩි බියට පත්වන දෙයක් ඔබලාට දැනුම් දෙන්නේද? යනුවෙන් ඇසීය. එසේමයි නබිතුමනී (දැනුම් දෙන්න) යනුවෙන් පැවැසුවෙමු. එවිට නබිතුමා එය රහසිගතව ෂිර්ක් කිරීමෙකි. එනම්, මිනිසෙකු සලාතය ඉටුකිරීම සඳහා සිටගෙන සිටී. එවිට කෙනෙකු මහුව බලමින් සිටින බැවින්, මහු තම සලාතය ඉතා හොඳින් (අලංකාරයෙන්) ඉටුකරයි'. යනුවෙන් පැවසීය. *(ඉබ්නු මාජා ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-මුනිච්චාව ගැන බියවීම හා මුනිච්චාවද එය කරන්නාද දැඩි ලෙස අවවාද කිරීම.
2-නිශ්චයෙන්ම මිනිසා සමහර අවස්ථාවක තමාගේ නොදැනුවත් කමින් මුනිච්චාවෙහි වැටේ.
3-නියතවශයෙන්ම අන් අයට පෙන්වීම සඳහා කරන ක්‍රියාවන් ප්‍රතික්ෂේප කොට පිළිගනු නොලැබේ.

# 4-ප්‍රාර්ථනාව

අල්ලාහ් ප්‍රාර්ථනා කිරීම පිළිබඳව මෙසේ පවසන්නේය.

﴿وقال ربكم ادعو ني أستجب لكم﴾ [غافر : ٦٠]

ඔබ දෙවියා 'මා වෙතම ඔබලා ප්‍රාර්ථනා කරන්න, මා ඔබලා (ගේ ප්‍රාර්ථනාවන්)ට පිළිතුරු ලබා දෙන්නෙමි'. යනුවෙන් පවසන් නේය. *(අල්කුර්ආන්-40:60)*

﴿وإذا سألك عبادي عنى فإني قر يب، أجيب دعوة الداع إذا دعان...﴾

[البقرة :١٨٦]

(නබිතුමනි) මාගේ දාසයන් මා ගැන ඔබෙන් අසන්නේනම්, 'නියතවශයෙන්ම සමීපයෙන්ම මා සිටින්නෙමි. මා වෙත ප්‍රාර්ථනා කළේද, ප්‍රාර්ථනා කරන්නාගේ ප්‍රාර්ථනාවට මා පිළිතුරු ලබා දෙන්නෙමි. (යනුවෙන් පවසන්න) *(අල්කුර්ආන්-2:186)*

﴿ادعوا ربكم تضرعا وخفية، إنه لا يحب المعتدين﴾ [الأعراف : ٥٥]

(එබැවින්, විශ්වාසවන්තයිනි) ඔබලාගේ දෙවියාගෙන්, කීකරු වෙන් හා බිය භක්තියෙන් ප්‍රාර්ථනා කරන්න. නියත වශයෙන්ම අල්ලාහ් සීමා ඉක්මවා යන්නන් ප්‍රිය නොකරන්නේය. *(අල්කුර් ආන්-7:55)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව නුහ්මාන් බින් බෂීර් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[الدعاء هو العبادة] (رواه الترمذى وأبو داود)

ප්‍රාර්ථනා කිරීම, එය ඇදහීමකි. *(තිර්මිදී හා අබූදාවුද් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ හුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[أقرب ما يكون العبد من ربه وهو ساجد فأكثروا الدعاء] (رواه مسلم)

දාසයා තම දෙවියා කෙරෙහි ඉතාමත් සමීපයෙන් සිටින්නේ මහු සුජූදයෙහි සිටියදීය. එබැවින්, (එහිදී) අධික වශයෙන් ප්‍රාර්ථනා කරන්න. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

[كان رسول الله ﷺ يستحب الجوامع من الدعاء ويدع ما سوى ذلك]

(رواه أبو داود)

නබි මුහම්මදු (සල්) තුමා ගැඹුරු අර්ථ සහිත කෙටි වචන වලින් යුත් ප්‍රාර්ථනාවන් ප්‍රිය කරමින්ද, එයට අමතර ප්‍රාර්ථනාවන් වළක්වමින්ද සිටීය. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ජාබිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[ما من عبد مسلم يدعو بدعاء إلا آتاه الله ما سأل، أو ادخر الله له في الآخرة خيرا منه، أو كف عنه من السوء مثله ما لم يدع بإثم أو قطيعة رحم] (رزين)

කිසියම් ප්‍රාර්ථනාවක් කළ කවරෙකු හෝ මුස්ලිම් දාසයාට අල්ලාහ් මහු ඇසූ දෙය ලබා දෙයි. නොඑසේනම්, එය (මහු ඇසූ දෙය)ට වඩා ශ්‍රේෂ්ඨයක් පරලොවෙහිදී මහුට ඉතුරුකර ලබා දෙයි. නොඑසේනම්, මහු කළ ප්‍රාර්ථනාවට සමාන පාප ක්‍රියාවන් මහුගෙන් ඉවත් කරයි. මහු පාප කාර්‍යයන් හෝ ඥාතිත්වයෙන්

වෙන්වීම කෙරෙහී හෝ ප්‍රාර්ථනා නොකළ (සිටීම කොන්දේසි යෙකි) යුතුයි. *(රසීන් ග්‍රන්ථය ඇසුරෙනි)* නබි (සල්) තුමා පැවැසූ බව අබුදර්දා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[دعوة المسلم لأخيه بظهر الغيب مستجابة، عند رأسه ملك موكل كلما دعا لأخيه بخير قال الملك الموكل به: آمين، ولك بمثل] (رواه مسلم)

මුස්ලිමෙකු තම සහෝදරයාට (ඔහු ඉදිරියෙහි නොසිට) සැඟව කරන ප්‍රාර්ථනාවන් පිළි ගනු ලැබේ. ඔහුගේ හිස (ප්‍රදේශයෙ)හි ඔහු වෙනුවෙන් නියමවූ මලක් (දේව දූත)වරයෙක් සිටී. ඔහු තම සහෝදරයාට කුසල් කෙරෙහි ප්‍රාර්ථනා කරන අවස්ථාවන්හි ඔහු වෙනුවෙන් නියමවූ මෙම මලක්වරයා 'මෙම ප්‍රාර්ථනාව පිළි ගනු මැන (ආමීන්)' තවද, ඔබටද මෙසේම ලැබෙනු මැන' යනු වෙන් පවසයි. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1- ප්‍රාර්ථනාව ඇදහීමකි. එය අල්ලාහ් හැර අන් කිසිවෙකු වෙත හෝ යොමු නොකළ යුතුයි. කවරෙකු හෝ අල්ලාහ් හැර අන් කිසිවෙකුට මෙය යොමු කළේද, නිශ්චයෙන්ම, ඔහු අල්ලාහ්ට සමානකළ අයෙක් වන්නේය. නබි මුහම්මදු (සල්) තුමා ප්‍රාර්ථනාව ඇදහීමක් ලෙස එනම්, ප්‍රාර්ථනාව ඇදහීම්වලින් උතුම් කාර්යයක් ලෙස සළකා ඇති බැවින් එයට ශ්‍රේෂ්ඨ ස්ථානයක් හිමිව ඇති බව දැනගත යුතුයි.

2- ජවාමිඋල් කලිම්වලින් ප්‍රාර්ථනා කිරීම සතුටුදායක බව සේම, ප්‍රාර්ථනා කිරීමෙහි ශබ්දය පහත් කිරීමද සතුටුදායක කාර්ය යෙකි. ජවාමිඋල් කලිම් යනුවෙන් හැඳින්වන්නේ ගැඹුරු අර්ථ සහිත කෙටි වචනවලටය.

3-මිනිසෙකු තමාට හෝ තම ධනයට හෝ තම දරුවන්ට හෝ විරුද්ධව ප්‍රාර්ථනා කිරීමෙහි අවවාදකර ඇත.
4-මුස්ලිම්වරුන්ට සැඟව ප්‍රාර්ථනා කිරීම සතුටුදායකය.
5-ප්‍රාර්ථනා කරන්නාට ඔහු ප්‍රාර්ථනා කළ දේ ලබාදීම අනිවාර්ය නොවන්නේය. නමුත්, එම ප්‍රාර්ථනාවේ හේතුවෙන් ප්‍රාර්ථනාවෙහි ප්‍රාමාණයට ඔහුගේ පාප ක්‍රියාවන් ඉවත් කෙරේ හෝ පරලොව දිනය සඳහා එය ඉතුරුකර, එහිදී ඔහුට ඉතා අවශ්‍යවන අවස්ථාවෙහි එය ලබා දෙනු ලැබේ.

# 5-අධ්‍යාපනය

අධ්‍යාපන දැනුම් ඥානයෙහි අවශ්‍යතාවය පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ قل هل يستوي الذين يعلمون والذين لا يعلمون﴾ [الزمر :٩]

(නබිතුමනි) 'දැනුම්ඥානය ලබා සිටින්නන් හා දැනුම්ඥානය නොලබා සිටින්නන් සමානවන්නයන් වන්නෙහිද?' යනුවෙන් ඔබ පවසන්න. *(අල්කුර්ආන්-39:9)*

﴿ يرفع الله الذين آمنوا منكم والذين أوتوا العلم درجات﴾ [المجادلة : ١١]

ඔබලා (අතර සිටින) විශ්වාස වන්තයන්ගේත්, ඥානවන්තයන් ගේත් තරාතිරම අල්ලාහ් උසස් කරයි. *(අල්කුර්ආන්-58:11)*

﴿وقل رب زدني علما﴾ [طه :١١٤]

'දෙවියනේ, මාහට දැනුම් ඥානය වැඩිකර ලබා දෙනු මැන' යනුවෙන්ද ඔබ ප්‍රාර්ථනා කරන්න. *(අල්කුර්ආන්-20:114)*

﴿ إنما يخشى الله من عباده العلماء﴾ [فاطر :٢٨]

නිශ්චයෙන්ම, අල්ලාහ්ගේ දාසයන් අතරෙහි ඔහුට (ඉතාමත්) බිය භක්තියෙන් සිටින්නේ විද්වතුන් පමණී. *(අල්කුර්ආන්-35:28)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව මුආවියා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

﴿من يرد الله به خيرا يفقهه في الدين﴾ [متفق عليه]

අල්ලාහ් කවරෙකුට හෝ යහපතක් ලබාදීමට අදහස් කරන්නේනම්, ඔහුට ධර්මයෙහි මනා අවබෝධයක් ලබා දෙයි. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[من علم علما فله أجر من عمل به لا ينقص من أجر العامل شيء] (ابن ماجة)

කවරෙකු හෝ දැනුම් ඥානයක් ඉගැන්වූයේද, ඒ අනුව ක්‍රියා කළ අයට ලැබෙන කුලිය(ට සමාන කුලියක්) ඔහුටද ලැබේ. නමුත්, ක්‍රියාකළ අයගේ කුලියෙන් කිසිවක් හෝ අඩු නොකරේ. *(ඉබ්නු මාජා ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ හුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[إذا مات ابن آدم انقطع عمله إلا من ثلاث، صدقة جارية، أو علم ينتفع به، أو ولد صالح يدعو له] (رواه مسلم)

ආදම්ගේ පුත්‍රයෙක් (මිනිසෙක්) මරණයට පත්වන්නේනම්, (ඔහුගේ) කාර්‍යයන්හි තුනක් හැර අන් සියලු කාර්‍යයන් ඔහු වෙතින් ඉවත්වේ. ඒවා, ස්ථිර සදකාව (දානය), ප්‍රයෝජනවත් දැනුම් ඥානය හා ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කරන යහපත් දරුවාය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බවට සහ්ල් බින් සඃද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[والله لأن يهدي الله بك رجلا واحدا خير لك من حمر النعم] (رواه البخاري)

අල්ලාහ් මත දිවුරා කියමි. අල්ලාහ් ඔබ මගින් කෙනෙකුට යහමග පෙන්වීම, ඔබට රතු පැහැති ඔටුවන් ලැබීමට වඩා උතුම්ය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් අම්ර් බින් අල් ආස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[بلغوا عني ولو آية] (رواه البخاري)

මගෙන් එක වැකියක් හෝ ලැබුනද එය අන් අය වෙත පතුරු වන්න. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-ඉහත සඳහන් අල්කුර්ආන් වැකි හා නබි වදන්වල අධ්‍යාපනය හා විද්වතුන්ගේ ශ්‍රේෂ්ඨ භාවය පැහැදිලිකර ඇත. අධ්‍යාපනය ලබාගැනීම ස්වර්ගයෙහි පිවිසීමට හේතුවන කාරණාවලින් එකක් වන සේම, ධර්මයෙහි පැහැදිලිවීමක් ලැබීම අල්ලාහ් දාසයාට යහපතක් සිතීම කෙරෙහි සාධකයෙකි.

2-මිනිසුන්ට අධ්‍යාපනය ලබාදීම, ඔවුන්ට යහපත් කාර්‍යයන් පිළිබඳව දැනුවත් කිරීම හා අධ්‍යාපනය පතුරුවීම යනාදීන් සඳහා ඒවා සුළු වශයෙන් හෝ වේවා ශ්‍රේෂ්ඨමත් කුලිය ලැබේ. තවද මිනිසාගේ මරණයට පසුවද එය ප්‍රයෝජන වන්නේය.

3-අධ්‍යාපනය ලබා ගැනීම කාලීන (සුන්නත්) ඇදහීම්වලට වඩා උතුම්ය.

4-දරුවන් යහපත් මාර්ගයෙහි පුහුණු කිරීමට උනන්දුවීම.

# 6-අණකිරීම හා වළක්වාලීම

යහපත් කාර්‍යයන් කෙරෙහි දේශනා කිරීම හා අයහපත් කාර්‍යයන් වළක්වාලීම පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿كنتم خير أمة أخرجت للناس تأمرون بالمعروف وتنهون عن المنكر وتؤمنون بالله﴾ [آل عمران : ١١٠]

මනුෂ්‍යයන් අතරෙහි බිහිකරන ලද සමාජයන් අතර ඔබලා ශ්‍රේෂ්ඨවන්ත සමාජයෙකි. (මක්තිසාදයන්) ඔබලා යහපත් කරුණු දේශනා කරන්නෝය. අයහපත් කරුණු වළක්වමින් සිටින්නෝය. අල්ලාහ්ව විශ්වාස කරන්නෝය. *(අල්කුර්ආන්-3:110)*

﴿ولتكن منكم أمة يدعون إلى الخير ويأمرون بالمعروف وينهون عن المنكر وأولئك هم المفلحون﴾ [آل عمران :١٠٤]

තවද, (මනුෂ්‍යයන්) කුසල් කෙරෙහි කැඳවන්නන් ලෙසත්, යහපත් කරුණු කෙරෙහි (මනුෂ්‍යයන්ට) දේශනා කරන්නන් ලෙසත්, අයහපත් කාර්‍යයන් වළක්වන්නන් ලෙසත් ඔබලා අතර කණ්ඩායමක් සිටිය යුතුයි. තවද, විජයග්‍රාහිකයන් ඔවුන්මය. *(අල්කුර්ආන්-3:104)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන්දුන් බව අබූසර්ද් අල් කුද්රි (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[من رأى منكم منكرا فليغيره بيده، فإن لم يستطع فبلسانه، فإن لم يستطع فبقلبه وذلك أضعف الإيمان] (مسلم)

ඔබලාගෙන් කවරෙකු හෝ අසතුටුදායක කාර්‍යයක් දුටුවේද, එය තම අතින් වැළැක්විය යුතුයි. ඒ සඳහා ඔහුට ශක්තියක් නොවන්නේද, ඔහු තම දිවෙන් එය වැළැක්විය යුතුයි. ඒ සඳහාද ඔහුට ශක්තියක් නොවන්නේද, ඔහු තම සිතෙන් එය වැළැක්විය යුතුයි. මෙය ඊමාන(විශ්වාසයෙ)හි ඉමහත් දුර්වලකමකි. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව හුදෛෆා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[والذي نفسي بيده لتأمرن بالمعروف ولتنهون عن المنكر أو ليوشكن الله أن يبعث عليكم عقابا منه ثم تدعونه فلا يستجاب لكم] (رواه الترمذي)

මාගේ පණ කවරෙකුගේ අතෙහි තිබේද, එම තැනැත්තා(වූ අල්ලාහ්) මත දිවුරා කියමි. ඔබලා යහපත් කාර්‍යයන් කෙරෙහි දේශනා කරමින්ද, අයහපත් කාර්‍යයන් වළක්වමින්ද සිටින්න. (එසේ නොකළේනම්) නියතවශයෙන්ම අල්ලාහ් ඔබලා කෙරෙහි ඔහුගේ දඬුවම සීඝ්‍රයෙන් පමුණුවන්නේය. පසුව ඔබලා ඔහු වෙත ප්‍රාර්ථනා කළද, ඔබලාට එය නොපිළිගැනේ. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව අබූබක්ර් සිද්දීක් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[إن الناس إذا رأوا الظالم فلم يأخذوا على يديه أوشك الله أن يعمهم بعقاب منه] (رواه أبوا داود والترمذي والنسائي)

නිසැකයෙන්ම, මිනිසුන් අපරාධකාරයාගේ දැත් අල්ලා ඔහුව (එයින්) නොවළක්වන්නේද, අල්ලාහ් තම දඬුවම සැවෝටම පොදුවට පත් කරයි. *(අබූදාවූද්, තිර්මිදි හා නසාඉ ග්‍රන්ථ ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-යහපත් කාර්‍යයන් අණ කිරීම හා අයහපත් කාර්‍යයන් වළක් වාලීම ජයග්‍රහණයට කාරණයක්ය.

2-අයහපත් කාර්‍යයක් දුටු තැනැත්තා තම ශක්තිය තරමට එය වළක්වාලීම අනිවාර්‍යවේ.

3-අතින් වළක්වාලීම යනුවෙන් හැඳින්වන්නේ, ඒ සඳහා උරුම කම් ලැබීමකි. උදාහරණයක් ලෙස පියෙකු තම නිවෙසෙහි සිටින අය වළක්වාලීම හෝ බලධාරියෙකු හෝ ඔහු වෙනුවෙන් සිටින්නෙකු තම යටතේ සිටින්නන් වළක්වාලීම යන්නෙකි.

4-සිතෙන් වළක්වාලීම යනුවෙන් හැඳින්වන්නේ, අකුසල් ක්‍රියාවන් කෙරෙහි අසතුටුවීම හා එයින් ඈත්වී සිටීමකි.

5-යහපත් කාර්‍යයන් අණ කිරීමෙන්ද අයහපත් කාර්‍යයන් වළක් වාලීමෙන්ද ඉවත්වී සිටීම අල්ලාහ්ගේ දඬුවමට හේතුවන සේම, ප්‍රාර්ථනාවන් පිළිනොගැනීමටද හේතුවන්නේය.

# 7-අණකිරීම් හා වළක්වාලීම් හි පිළිවෙල

යහපත් කාර්‍යයන් අණ කිරීම හා අයහපත් කාර්‍යයන් වළක් වාලීමෙහි පිළිවෙල් පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ أُدْعُ إِلَى سَبِيْلِ رَبِّكَ بِالْحِكْمَةِ وَالْمَوْعِظَةِ الْحَسَنَةِ وَجَادِلْهُمْ بِالَّتِيْ هِيَ أَحْسَنُ ﴾ [النحل: ١٢٥]

(නබිතුමනි) ඔබ දෙවියාගේ මගෙහි සූක්ෂම ලෙසත්, අලංකාර දේශනාවෙනුත් (මිනිසුන්) කැඳවන්න. තවද, මවුන් සමග යහපත් ශීලයෙන් තර්ක කරන්න. *(අල්කුර්ආන්-16:125)*

﴿فَبِمَا رَحْمَةٍ مِّنَ اللهِ لِنْتَ لَهُمْ، وَلَوْ كُنْتَ فَظًّا غَلِيْظَ الْقَلْبِ لاَنْفَضُّوْا مِنْ حَوْلِكَ﴾ [آل عمران: ١٥٩]

ඔබ ඔවුන් සමග සිහිඳුකමින් හැසිරෙන්නේ, අල්ලාහ්ගේ භාග්‍ය අනුවය. ඔබ (වචනයෙහි) අප්‍රසන්න ගතියෙන්ද, තද හෘද යෙන්ද සිටියේනම්, ඔවුන් ඔබ සමාජය අතහැර (පැන) යන්නට ඇති. *(අල්කුර්ආන්-3:159)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

[إِنَّ اللهَ رَفِيْقٌ يُحِبُّ الرِّفْقَ فِي الْأَمْرِ كُلِّهِ] (متفق عليه)

නිශ්චයෙන්ම, අල්ලාහ් සිහිඳුකාරයාය. ඔහු සෑම කාර්‍යයන් හිම සිහිඳුකම ආදරය කරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ආයිෂා (රලි) තුමිය මෙසේ පවසන්නීය.

[إِنَّ الرِّفْقَ لاَ يَكُوْنُ فِيْ شَيْءٍ إِلاَّ زَانَهُ، وَلاَ يُنْزَعُ مِنْ شَيْءٍ إِلاَّ شَانَهُ] (مسلم)

සිහිඳුකමින් කරන සියලු කාර්‍යයන්ම අලංකාරයෙන් පවතී. සිහිඳුකමින් තොරව කරන කාර්‍යයන් සියල්ල ඌණතාවයෙන් පවතී. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව ජුරෙර් බින් අබ්දුල්ලාහ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[مَنْ يُحْرَمُ الرِّفْقَ يُحْرَمُ الْخَيْرَ كُلَّهُ] (رواه مسلم)

කවරෙකු සිහිදුකම වළක්වා සිටින්නේද, ඔහු කුසල් සියල්ල වළක්වා සිටින්නාය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-සිහිදුකමින් හැසිරීමටද කැඳවීමෙහි සූක්ෂමය පිළිපැදීමටද හා යහපත් කාර්‍යයන් අණ කිරීම සහ අයහපත් කරයයන් වළක් වාලීමටද උනන්දු කිරීම.
2-සෑම කාර්‍යයන් කෙරෙහි සිහිදුකමින් යෙදීමට උනන්දු කිරීම. නිශ්චයෙන්ම, සිහිදුකම වළක්වා සිටින්නා කුසල් කාර්‍යයන් සියල්ල වළක්වා සිටින්නාය.

# 8-දෙමාපියන්ට උපකාර කිරීම

දෙමාපියන්ට උපකාර කිරීමෙහි අවශ්‍යතාවය හා ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَوَصَّيْنَا الْإِنْسَانَ بِوَالِدَيْهِ حُسْنًا﴾ [العنكبوت :٨]

තම දෙමාපියන්හට උපකාර කරන මෙන් අපි මිනිසුන්ට අණ කර ඇත්තෙමු. *(අල්කුර්ආන්-29:8)*

﴿وَقَضَى رَبُّكَ أَلاَّ تَعْبُدُوْا إِلاَّ إِيَّاهُ وَبِالْوَالِدَيْنِ إِحْسَانًا،إِمَّا يَبْلُغَنَّ عِنْدَكَ الْكِبَرَ أَحَدُ هُمَا أَوْ كِلاَهُمَا فَلاَ تَقُلْ لَّهُمَا أُفٍّ وَّلاَ تَنْهَرْهُمَا وَقُلْ لَّهُمَا قَوْلاً كَرِيْمًا﴾

[الإسراء :٢٣]

ඔහුට හැර (අන් කිසි කෙනෙකුට) ඔබ ඇදහීම් නොකළ යුතු බවත්, දෙමාපියන්ට උපකාර කළ යුතු බවත්, ඔබගේ දෙවියා තීර ණය (අණ)කර ඇත. ඒ දෙදෙනා අතර කෙනෙක් හෝ දෙදෙනා හෝ ඔබ අතරෙහි මහලුකමට පත්වූයේනම්, ඔවුන්ට උෆ් (ඕ)

යනුවෙන් (පිළිකුල හඟවමින්) නොකියන්න. ඔවුන් දෙදෙනා (ඔබ අතරෙහි සිට) තැරපීමද නොකරන්න. තවද ඔවුන් දෙදෙනා සමග ගෞරවයෙන් කතා බහ කරන්න. *(අල්කුර්ආන්-17:23)*

﴿وَوَصَّيْنَا الإِنْسَانَ بِوَالِدَيْهِ، حَمَلَتْهُ أُمُّهُ وَهْنًا عَلَى وَهْنٍ وَفِصَالُهُ فِيْ عَامَيْنِ أَنِ اشْكُرْلِيْ وَلِوَالِدَيْكَ ...﴾ [لقمان :١٤]

අපි මිනිසාට 'තම දෙමාපියන් (දෙදෙනාටම උපකාර කිරීම) පිළිබඳව වසියයත් (අණ)කර ඇත්තෙමු. ඔහුගේ මව අසරණයෙන් පිට අසරණයවී ඔහුව තම ගැබ්හි උසුලාගෙන සිටියේය. තවද, ඔහුට කිරි වැරීමට වසර දෙකක් විය. එබැවින්, මාහටද ඔබ දෙමා පියන්හටද තුති පුද කරන්න... *(අල්කුර්ආන්-31:14)*

මුහම්මදු (සල්) තුමාගෙන් තමා මෙසේ විමසූ බව අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

سَأَلْتُ النَّبِيَّ ﷺ: أَيُّ الْعَمَلِ أَحَبّ إِلَى الله ؟ قال :[الصَّلاَةُ عَلَى وَقْتِهَا] قُلْتُ ثُمَّ أَيُّ ؟ قَالَ: [بِرُّالْوَالِدَيْنِ] قُلْتُ ثُمَّ أَيُّ ؟ قَالَ :[الجِهَادُ فِي سَبِيْلِ الله]

(متفق عليه)

මා නබි මුහම්මදු (සල්) තුමාගෙන් ක්‍රියාවන් අතර අල්ලාහ්ට ඉතා සතුටුදායක ක්‍රියාව කුමක්ද?' යනුවෙන් ඇසුවෙමි. එයට නබිතුමා 'සලාතය එයට අයත් නිසි වේලාවට ඉටු කිරීමකි'. යනුවෙන් පැවැසීය. පසුව කුමක්ද? යනුවෙන් ඇසුවෙමි. එයට 'දෙමා පියන්ට උපකාර කිරීමකි' යනුවෙන් එතුමා කීය. පසුව කුමක්ද? යනුවෙන් ඇසුවෙමි. එයට එතුමා 'අල්ලාහ්ගේ මාර්ගයෙහි ජිහාද් කිරීමකි' යනුවෙන් පැවැසීය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

අබූ හුරෙයිරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

جَاءَ رَجُلٌ إِلَى رَسُوْلِ اللهِ ﷺ فَقَالَ : يَارَسُوْلَ اللهِ، مَنْ أَحَقُّ النَّاسِ بِحُسْنِ صَحَابَتِي ؟ قَالَ :[أُمُّكَ] قَالَ ثُمَّ مَنْ ؟ قَالَ :[أُمُّكَ] قَالَ ثُمَّ مَنْ ؟ قَالَ : [أُمُّكَ] قَالَ ثُمَّ مَنْ ؟ قَالَ :[أَبُوْكَ] (متفق عليه)

මිනිසෙකු, නබි මුහම්මදු (සල්) තුමා වෙත පැමිණ නබිතුමනි, මා යහපත් ශීලයෙන් මිත්‍රත්වය පවත්වාගෙන යාමට මිනිසුන් අතර ඉතා සුදුස්සා කවරෙකුද? යනුවෙන් ඇසීය. එයට නබිතුමා ඔබේ මවය යනුවෙන් පැවැසීය. පසුව කවරෙකුද? යනුවෙන් විමසීය. එයටද නබිතුමා ඔබේ මවය යනුවෙන් පැවැසීය. පසුව කවරෙකුද? යනුවෙන් ඔහු ඇසීය. එයටද නබිතුමා ඔබේ මවය යනුවෙන් පැවැසීය. පසුව කවරෙකුද? යනුවෙන් ඔහු නැවත විමසීය. එයට එතුමා ඔබේ පියාය යනුවෙන් පැවැසීය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-ඉස්ලාම් ධර්මය දෙමාපියන්ට ගරු කරයි, ඔවුන් දෙදෙනාට වහල්වන ලෙස අණකරන අතර, ඔවුන්ට උපකාර කරන ලෙස ද උනන්දු කරවයි.

2-නියතවශයෙන්ම, නිසි වේලාවට ඉටුකරන සලාතයෙන් පසු අල්ලාහ්ට ඉතාමත් සතුටුදායක ක්‍රියාව වන්නේ දෙමාපියන්ට උපකාර කිරීමකි.

3-ඔවුන් දෙදෙනා වේදනා කිරීම, ඔවුන් සමග පරුෂ වචනයෙන් කතා බහ කිරීම හා ඔවුන්ට (පිළිකුල් සිතුවිල්ලෙන්) චී යනුවෙන් කීම යනාදීන් ඉස්ලාම් ධර්මය තරයේම අවවාද කරයි.

4-මවකුගේ තරාතිරම පැහැදිලි කරයි. වහල්වීමෙන් හා උපකාර කිරීමෙන් පියාට වඩා මවට ප්‍රමුඛතාවය ලබාදී ඇත.

# 9-යහපත් ගුණාංග

යහපත් ගුණාංගයන් පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وإنك لعلى خلق عظيم﴾ [القلم:٤]

තවද, (නබිතුමනි) නිසැකයෙන්ම ඔබ උතුම් ශ්‍රේෂ්ඨ ගුණාංග ශීලයෙන් සිටින්නේය. *(අල්කුර්ආන්-68:4)*

﴿فبما رحمة من الله لنت لهم، ولو كنت فظا غليظ القلب لانفضوا من حولك﴾ [آل عمران:١٥٩]

ඔබ ඔවුන් සමග සිනිඳුකමින් හැසිරෙන්නේ, අල්ලාහ්ගේ භාග්‍ය අනුවය. ඔබ (වචනයෙහි) අප්‍රසන්න ගතියෙන්ද, තද හෘද යෙන්ද සිටියේනම්, ඔවුන් ඔබ සමාජය අතහැර (පැන) යන්නට ඇති. *(අල්කුර්ආන්-3:159)*

මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූදර්දා (රලි) තුමා මෙසේ පවසන්නේය.

[ما من شيء أثقل في ميزان العبد يوم القيمة من حسن الخلق وإن الله يبغض الفاحش البذي] (رواه الترمذي)

අවසාන දිනයේ දාසයාගේ තරාදියෙහි යහපත් ගුණාංගයට වඩා බරවන කිසියම් දෙයක් නොමැත. නියතවශයෙන්ම අල්ලාහ් පිළිකුල් වචනයෙන් කතා බහ කරන තැනැත්තාව කෝප කරයි. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

سئل رسول الله ﷺ عن أكثر ما يدخل الناس الجنة فقال [تقوى الله وحسن الخلق] (رواه الترمذي)

මිනිසුන් ස්වර්ගයට පිවිසීමට හේතුවන කාරයයන් අතර ඉතා අධිකව පවතින කාරයයන් කුමක්ද ? යනුවෙන් නබි මුහම්මදු (සල්) තුමාගෙන් ඇසීය. එවිට එතුමා එය 'අල්ලාහ් කෙරෙහි බිය භක්තිය හා යහපත් ගුණාංගය' යනුවෙන් පැවැසුවාය. *(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ හුරෛරා (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[أكمل المؤمنين إيمانا أحسنهم خلقا، وخياركم خياركم لنسائهم]

(رواه الترمذي)

විශ්වාස වන්තයන් අතර පරිපූරණ විශ්වාස වන්තයා, මවුන් ගෙන් ඉතා යහපත් ගුණාංගශීලයාය. ඔබලා අතර ඉමහත් ශ්‍රේෂ්ඨ වන්තයා මවුන්ගේ බිරිඳයන් අතර ශ්‍රේෂ්ඨ වන්තයාය. *(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව ආයිෂා (රළි) තුමිය මෙසේ වාර්තා කරන්නේය.

سمعت رسول الله ﷺ يقول :[إن المؤمن ليدرك بحسن خلقه درجة الصائم القائم] (رواه أبو داود)

නිශ්චයෙන්ම විශ්වාස වන්තයා තම යහපත් ගුණාංග නිසා මහුට (දහවල් කාලයෙහි) උපවාසයේ යෙදීසිට (රාත්‍රී කාලයෙහි) සිටගෙන ඇදහීම් කළ කෙනෙකුගේ තරාතිරම ලැබෙන්නේය. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-නබි මුහම්මදු (සල්) තුමාගේ යහපත් ගුණාංගශීලය පැහැදිළිය.
2-යහපත් ගුණාංගශීලයේ ශ්‍රේෂ්ඨතාවය හා එහි තරාතිරම. නිශ්චය වශයෙන්ම යහපත් ගුණාංගයන් ස්වර්ගයට පිවිසීමට හා තරාතිරම උසස් කිරීමට හේතුවන කාර්යයන් අතර වැදගත් කාර්යයෙකි. ක්‍රියාවන් පරලොව දිනයෙහි මැන බලනු ලැබේ. මුස්ලිම්වරයෙකුගේ තරාදියෙහි ඉතා බර සහිතවීමට අල්ලාහ් කෙරෙහි බියභක්තිය හා යහපත් ගුණාංග හේතුවන්නේය.
3-ඉස්ලාම් ධර්මය යහපත් කියමන් හා ක්‍රියාවන් කෙරෙහි උනන්දු කරන අතර, අයහපත් කියමන් හා ක්‍රියාවන් කෙරෙහි අවවාද කරන්නේය.
4-අමු සැමියන්ගේ යහපත් හැසිරීම පිළිබඳ වැදගත්කම.
5-නිශ්චයවශයෙන්ම, විශ්වාසය අවනතවීමෙන් වැඩිවේ හා පාප ක්‍රියාවෙන් ඌණවේ.

# 10-සිනිඳුකම හා සැනසුම

සිනිඳුකම හා සැනසුම පිළිබඳව අල්ලාහ් මෙලෙස පවසන්න්ය.

﴿فبما رحمة من الله لنت لهم، ولو كنت فظا غليظ القلب لانفضوا من حولك﴾ [آل عمران:١٥٩]

ඔබ ඔවුන් සමග සිනිඳුකමින් හැසිරෙන්නේ, අල්ලාහ්ගේ භාග්‍ය අනුවය. ඔබ (වචනයෙහි) අප්‍රසන්න ගතියෙන්ද, තද හෘද යෙන්ද සිටියේනම්, ඔවුන් ඔබ සමාජය අතහැර (පැන) යන්නට ඇති. *(අල්කුර්ආන්-3:159)*

මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්තිය.

[إن الله رفيق يحب الرفق في الأمر كله] (متفق عليه)

නියතවශයෙන්ම, අල්ලාහ් සිහිඳුකමින් සිටී. ඔහු සෑම ක්‍රියාවන් කෙරෙහි සිහිඳුකම ප්‍රිය කරයි. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා අෂජ්ජු අබ්දුල් කෛස්ට පැවැසූ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

قال رسول الله ﷺ لأشج عبد القيس [إن فيك خصلتين يحبهما الله: الحلم والأناة] (رواه مسلم)

නිශ්චයෙන්ම, ඔබ වෙත අල්ලාහ් ප්‍රිය කරන ඉවසීම හා සිහිඳුකම යන ලක්ෂණ දෙකක් තිබේ *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

[إن الرفق لا يكون في شيء إلا زانه، ولا ينزع من شيء إلا شانه] (رواه مسلم)

සිහිඳුකමින් කරන සියලු කාර්යයන්ම අලංකාරයෙන් පවතී. සිහිඳුකමින් තොරව කරන කාර්යයන් සියල්ල ඌණයෙන් පවතී. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව ජුරෛර් බින් අබ්දුල්ලාහ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[من يحرم الرفق يحرم الخير كله] (رواه مسلم)

කවරෙකු හෝ සිහිඳුකම වළක්වා සිටින්නේද, ඔහු කුසල් සියල්ල වළක්වා සිටින්නාය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-අල්ලාහ්ගේ සිහිඳුකම ප්‍රිය කරයි. නිශ්චයෙන්ම, සිහිඳුකමින් ක්‍රියා කිරීම කුසල් ලබාදීමට හේතුවේ.
2-නිශ්චයෙන්ම, මිනිසුන් අතර ගනුදෙනු කිරීමේදී සිහිඳුකමින් හැසිරීම ස්වර්ග වැසියන්ගේ ගුණාංගයෙකි.
3-ඉවසීමේ ශ්‍රේෂ්ඨතාවය හා කෝපවීම කෙරෙහි අවවාදය.

# 11-කරුණාව

අල්ලාහ් නබි මුහම්මදු (සල්) තුමා ගැන මෙසේ පවසන්නේය.

﴿بالمؤمنين رؤوف رحيم﴾ [التوبة:١٢٨]

(මුහම්මදු නබි තුමා) විශ්වාසවන්තයන් අතර කරුණාවෙන් හා දයාවෙන් සිටින්නේය. *(අල්කුර්ආන්-9:128)* තවද අල්ලාහ් විශ්වාසීන් ගැන මෙලෙස පවසන්නේය.

﴿رحماء بينهم﴾ [الفتح:٢٩]

(නබි (සල්) තුමා සමග සිටින්නන්) ඔවුන් අතරෙහි කරුණා වන්තයන් ලෙස සිටිති. *(අල්කුර්ආන්-48:29)*

නබි මුහම්මදු (සල්) තුමා පැවසූ බව ජරීර් බින් අබ්දුල්ලාහ් මෙසේ වාර්තා කරන්නේය.

[لا يرحم الله من لا يرحم الناس] (متفق عليه)

මිනිසුන් කෙරෙහි කාරුණික නොවන්නාට අල්ලාහ් කාරුණික නොවන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව අබූ හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[لا تنزع الرحمة إلا من شقي] (رواه أحمد والترمذي)

දුර්භාග්‍ය වන්තයාගෙන් කරුණාව ඉවත් කෙරේ. *(අහ්මද් හා තිර්මිදී ග්‍රන්ථ ඇසුරෙනි)*

## ප්‍රයොජන

1-නිශ්චයෙන්ම, කාරුණිකවීම විශ්වාසීන්ගේ ගුණාංගයෙකි.
2-නිශ්චයෙන්ම, මිනිසුන්ට කාරුණිකවීම අල්ලාහ්ගේ කරුණාවෙහි පිවිසීමට හේතුවෙකි.
3-නිශ්චයෙන්ම, හෘදයෙන් කරුණාව ඉවත්වීම දුර්භාග්‍ය මිනිසාගේ සළකුණකි.

# 12-අපරාධ නොකිරීම

අපරාධය පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ما للظالمين من حميم ولا شفيع يطاع﴾ [غافر :١٨]

අපරාධ කරුවන්ට, කාරුණිකවන මිත්‍රයාද, පිළිගනු ලබන නිර්දේශ කරන්නාද හෝ නොසිටී. *(අල්කුර්ආන්-40:18)*

අල්ලාහ් මාර්ගයෙන් මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූදර් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[يا عبادي إني حرمت الظلم على نفسي وجعلته بينكم محرما، فلا تظالموا]

(رواه مسلم)

මාගේ දාසයාණෙනි, නිශ්චයෙන්ම මා, අපරාධ කිරීම මාහට තහනම් කළෙමි. ඔබලා අතරද එය මා තහනම් කළෙමි. එබැවින් ඔබලා(ගෙන් කෙනෙකු අන් කෙනෙකුට) අපරාධ නොකරන්න.. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවසූ බව ජාබිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[إتقوا الظلم فإن الظلم ظلمات يوم القيامة...] (رواه مسلم)

අපරාධ කිරීම කෙරෙහි බියවන්න. නියතවශයෙන්ම අපරාධය පරලොව දිනයෙහි අන්ධකාරයකි. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

තමාව යෙමන් දේශය කරා පිටත්කළ අවස්ථාවේ මුහම්මදු (සල්) තුමා (තමාට) මෙසේ පැවසූ බව මුආද් බින් ජබල් (රලි) තුමා වාර්තා කරන්නේය.

[واتق دعوة المظلوم فإنه ليس بينها وبين الله حجاب] (متفق عليه)

අපරාධයට ලක්වූ තැනැත්තාගේ ප්‍රාර්ථනාව (ශාපය)ට බිය වන්න. නිශ්චයවශයෙන්ම, එම ශාපය හා අල්ලාහ් අතර කිසියම් ආවරණයක් නොමැත. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවසූ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරයි.

[من كانت عنده مظلمة لأخيه من عرضه أو من شيء فليتحلله من قبل ألا يكون دينار ولا درهم، إن كان له عمل صالح أخذ منه بقدر مظلمته، وإن لم يكن له حسنات أخذ من سيئات صاحبه فحمل عليه] (رواه البخاري)

කවරෙකු හෝ තම සහෝදරයාට නින්දා කළේද? හෝ ඔහුට අයත් කිසියම් සම්පතක් අපරාධයෙන් තම සතු කළේද? දීනාර් හා දිර්හම් නොමැතිව යාමට (පරලොව පැමිණීමට) පෙර එය (නැවත) ඔහුට ලබා දිය යුතුයි. ඔහු වෙත කුසල් ක්‍රියා තිබේ නම් ඔහු කළ අපරාධයෙහි ප්‍රමාණයක් එයින් ගනු ලැබේ. ඔහු

වෙත කුසල් ක්‍රියා නොවත්තේද, අපරාධයට ලක්වූ තැනැත්තා ගේ අකුසල් ක්‍රියාවන් ඔහු මත පටවනු ලැබේ. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-අපරාධ නොකිරීම හා එයින් වැළකී සිටීම.

2-අපරාධ කරන්නාට අයත් දඬුවම මෙලොවෙහිද පරලොවෙහිද උග්‍රය.

3-අපරාධය කළ අයට එරෙහිව අපරාධයට ලක්වූවන් කරන ප්‍රාර්ථනා (ශාපය) පිළිගෙනේ.

# 13-මුස්ලිම්වරයාගේ ජීවිතයෙහි ගරුත්වය

මුස්ලිමෙකුගේ ජීවිතයට හානි නොකර එය වගකීමෙන් රැක ගැනීමේ අවශ්‍යතාවය ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ومن يقتل مؤمنا متعمدا فجزاؤه جهنم خالدا فيها وغضب الله عليه ولعنه واعد له عذابا عظيما﴾ [النساء:٩٣]

යමෙකු ඕනෑකමින් විශ්වාස වන්තයෙකු මරා දමන්නේනම්, ඔහුට අයත් කුලිය අපායවේ. ඔහු එහි සදාකාලිකව සිටී. තවද, ඔහු ගැන අල්ලාහ් කෝපවී ඔහුට ශාප කරයි. තවද, ඔහු වෙනු වෙන් ඉමහත් වේදනා පිළියෙල කර තිබේ. *(අල්කුර්ආන්-4:93)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[أول ما يقضى بين الناس يوم القيمة في الدماء] (متفق عليه)

පරලොව දිනයෙහි මිනිසුන් අතර කෙරෙන ප්‍රථම තීන්දුව ලේ (ඝාතන හා තුවාල කිරීම්) පිළිබඳවය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් අම්ර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[لزوال الدنيا أهون عند الله من قتل رجل مسلم] (رواه النسائي والترمذي)

මුස්ලිම් වරයෙකු ඝාතනය කිරීමට වඩා මෙලොව විනාශවීම අල්ලාහ්ට ස්වල්පයෙකි. *(නසාඉ හා තිර්මිදී ග්‍රන්ථ ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-මුස්ලිම් වරයෙකු ඝාතනය කිරීම පිළිබඳ අවවාදය හා අල්ලාහ් වෙත මුස්ලිම් වරයෙකුට ඇති ගෞරවය පැහැදිලිවීම.
2-පරලොව දිනයෙහි මිනිසුන් අතර ප්‍රථමයෙන් තීන්දු කරනු ලබන්නේ ලේ පිළිබඳවය. මන්දයත්, එය මහා පාප ක්‍රියාවකි.
3-ඝාතනයට මෙලොවෙහි දඬුවම ඝාතනයෙකි. පරලොවෙහි දඬුවම සදාකාලිකව අපායේ සිටීමකි.

# 14-මුස්ලිම්වරයාගේ වගකීම

අල්ලාහ් මුස්ලිම්වරුන් පිළිබඳව මෙසේ පවසන්නේය.

﴿إنما المؤمنون إخوة﴾ [الحجرات:١٠]

නිශ්චය වශයෙන්ම, සෑම මුස්ලිම් වරුන්ම සහෝදරයන්ය. *(අල්කුර්ආන්-49:10)*

මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ මූසා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[المؤمن للمؤمن كالبنيان يشد بعضه بعضا] (رواه البخاري)

විශ්වාස වන්තයෙකු තව විශ්වාස වන්තයෙකුට උදාහරණය නම්, ගොඩනැගිල්ලක් සේය. එහි කොටසක් තව කොටසක් උසුලාගෙන (මුක්කුදී) සිටින්නේය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ හුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරයි.

[المسلم أخو المسلم لايخونه ولايكذبه ولايخذله كل المسلم على المسلم حرام عرضه وماله ودمه، التقوى ههنا، بحسب امرء من الشر أن يحقر أخاه المسلم] (رواه الترمذي)

මුස්ලිම්වරයෙකු අන් මුස්ලිම්වරයාට සහෝදරයාය. ඔහු ඔහුට වංචා, බොරු හා නින්දා නොකරයි. සෑම මුස්ලිම්වරයෙකුටම අන් මුස්ලිම්වරයාගේ ගෞරවය, සම්පත හා ලේ හරාම් (තහනම්)ය. (අල්ලාහ් කෙරෙහි) බියභක්තිය (නබිතුමා තම පපුව සංඥා කර මින්) මෙහි තිබේ. තම මුස්ලිම් සහෝදරයාට නින්දා කිරීම ඔහු අකුසල් කළ බවට ප්‍ර(ස)මාණවේ. *(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවසූ බව අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[لا يؤمن أحدكم حتى يحب لأخيه ما يحب لنفسه] (رواه البخاري)

තමා කැමැතිවන දෙයක්, තම සහෝදරයාටද කැමැති වන තෙක් ඔබෙන් කවරෙකු හෝ (සම්පූර්ණ) විශ්වාස වන්තයෙකු නොවන්නේය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරයි.

[من نفس عن مسلم كربة من كرب الدنيا نفس الله عنه كربة من كرب يوم القيمة، ومن يسر عن معسر في الدنيا يسر الله عليه في الدنيا والآخرة، ومن ستر مسلما في الدنيا ستره الله في الدنيا والآخرة، والله في عون العبد ماكان العبد في عون أخيه] (رواه الترمذي)

කවරෙකු මෙලොවෙහි මුස්ලිම්වරයෙකුගේ දුෂ්කරතාවයක් ඉවත් කළේද? පරලොවහි ඔහුගේ දුෂ්කරතාවයක් අල්ලාහ් ඉවත් කරයි. කවරෙකු මෙලොවෙහි පීඩාවක් සරල කළේද? අල්ලාහ් මෙලොවෙහි හා පරලොවෙහි ඔහුගේ පීඩාවන් සරල කරයි. කව රෙකු මෙලොවෙහි මුස්ලිම්වරයෙකුගේ ඌනතාවයක් (ප්‍රසිද්ධ නොකර) සඟවුවේද? මෙලොවෙහි හා පරලොවෙහි අල්ලාහ් ඔහු ගේ ඌණතාවයන් සඟවයි. දාසයෙකු තමාගේ සහෝදරයෙකුට උපකාර කරන කලක, අල්ලාහ් ඔහුට උපකාර කරමින් සිටී. *(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-විශ්වාසවන්තයා අන් විශ්වාස වන්තයාට සහෝදරයාවේ. ඔහු කුඩා හෝ ලොකු හෝ නොඑසේනම්, පාලකයා හෝ මහ ජනයා හෝ විය හැක.

2-මුස්ලිම්වරුන් අතර උපකාර කිරීම කෙරෙහි උනන්දු කිරීම. උපකාර අවශ්‍යවුවන් සැමට පාප ක්‍රියාවන් නොවන පරිදි උප කාර කිරීම.

3-අවශ්‍යවුවන්ට උපකාර කිරීමේ ශ්‍රේෂ්ඨය හා එයට අයත් උතුම් කුලිය.

# 15-අසල් වාසීන් පිළිබඳ වගකීම

මෙම කරුණ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿واعبدوا الله ولا تشركوا به شيئا وبالوالدين إحسانا وبذي القربى واليتامى والمساكين والجار ذى القربى والجار الجنب والصاحب بالجنب وابن السبيل ...﴾ [النساء:٣٦]

තවද, ඔබ සැමදෙනා අල්ලාහ්ටම අවනතව වැඳුම් පිඳුම් කර (ජීවත්ව)න්න. ඔහුට කිසියම් දෙයක් සමාන නොකරන්න. තවද, දෙමාපියන්හට උපකාර කර(යහපත් ශීලයෙන් හැසිරෙ)න්න. තවද, ඥාතීන්, අනාථයන් හා දිළිත්දන් සමඟ කීකරුවෙන් හැසි රෙන්න. තවද, ඥාති අසල්වැසියන්, ඥාතීන් නොවන අසල් වැසි යන්, කිට්ටුම මිත්‍රයන් හා මඟීන් ...... සමගද යහපත් ශීලයෙන් හැසිරෙන්න. *(අල්කුර්ආන් - 4:36)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[والله لا يؤمن، والله لا يؤمن، والله لا يؤمن] قيل : ومن يارسول الله ؟ قال [الذي لا يأمن جاره بوائقه] (رواه البخاري)

අල්ලාහ් මත දිවුරා කියමි, ඔහු විශ්වාසවන්තයා නොවන්නේය. අල්ලාහ් මත දිවුරා කියමි, ඔහු විශ්වාසවන්තයා නොවන්නේය. අල්ලාහ් මත දිවුරා කියමි, ඔහු විශ්වාස වන්තයා නොවන්නේය යනුවෙන් (තුන් වරක්) නබිතුමා පැවැසුවිට, ඔහු කවරෙකුද? යනු වෙන් එතුමාගෙන් අසන ලද්දේය. (එයට එතුමා) තම අසල් වැසියා කවරෙකුගේ අනීතිය කෙරෙහි බියෙන් සිටින්නේද ඔහුය. (යනුවෙන් පැවැසීය) *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෙයිරා (රලි) තුමා මෙසේ වාර්තා කරයි.

[من كان يؤمن بالله واليوم الآخر فلا يؤذ جاره، ومن كان يؤمن بالله واليوم الآخر فليكرم ضيفه، ومن كان يؤمن بالله واليوم الآخر فليقل خيرا أو ليصمت] (رواه البخاري)

කවරෙකු අල්ලාහ් හා අවසාන දිනය විශ්වාස කරමින් සිටින්නේද, ඔහු තම අසල්වාසීන්ට අවහිර නොකරමින් සිටින්න. කවරෙකු අල්ලාහ් හා අවසාන දිනය විශ්වාස කරමින් සිටින්නේද, ඔහු තම අමුත්තන්ට ආගන්තුක සංග්‍රහය කරන්න. කවරෙකු අල්ලාහ් හා අවසාන දිනය විශ්වාස කරමින් සිටින්නේද, ඔහු හොඳ දේ පවසන්න හෝ නිශ්ශබ්දව සිටින්න. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-අසල් වැසියන්ට උපකාර කිරීමටත් ඔවුන්ට අවහිර නොකිරීමටත් උනන්දුව හා නිශ්චය කිරීම.

2-අසල් වැසියා මුස්ලිම් නොවන අය හෝ වේවා ඔවුන්ට උපකාර කිරීම හා ඔවුන්ට නින්දා නොකිරීම මිනිසාගේ විශ්වාසයේ පරිපූර්ණත්වයෙකි.

# 16-දිවෙහි අනර්ථය

මිනිසාගේ දිවෙන් සිදුවන අනර්ථයන් පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿مايلفظ من قول إلا لديه رقيب عتيد﴾ [ق :١٨]

අවධානය යොමුකරමින් ලියන්නා (මලක්) ඔහු (මිනිසා) සමග නොමැතුව කිසියම් වචනයක් හෝ ඔහු නොපවසන්නේය. *(අල් කුර්ආන් -50:18)*

﴿ولا تقف ماليس لك به علم، إن السمع والبصر والفؤاد كل أولئك كان عنه مسئولا﴾ [بني اسرائيل :٣٦]

කුමක් ගැන ඔබට ඥානයක් (දැනුමක්) නොවන්නේද? එය (ක්‍රියාවෙහි යෙදීමෙන්) නොපිළිපදින්න. නිසැකයෙන්ම, බැල්ම, සවන්දීම හා හෘදයන් මේ සියල්ල පිළිබඳව (පරලොවෙහිදි) ප්‍රශ්න කරනු ලැබේ. *(අල්කුර්ආන් -17:36)*

අබූ මූසා අල් අෂ්අරි (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

سئل رسول الله ﷺ أي المسلمين أفضل؟ قال :[من سلم المسلمون من لسانه ويده] (رواه الترمذي)

නබිතුමනී, මුස්ලිම්වරුන් අතර ශ්‍රේෂ්ඨ වන්නයා කවරෙකුද? යනුවෙන් මා නබිතුමාගෙන් විමසීමි. එයට එතුමා 'කවරෙකුගේ දිවෙන් හා අතෙන් අන් මුස්ලිම්වරුන් (කිසිඳු පීඩාවට නොලක්වී) නිදහසේ සිටින්නේද ශ්‍රේෂ්ඨවන්තයා ඔහුය' යනුවෙන් පැවැසීය. *(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව සහ්ල් බින් සඃද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[من يضمن لي ما بين لحييه وما بين رجليه أضمن له الجنة] (رواه البخاري)

කවරෙකු තම හක්ක දෙක හා කලව දෙක අතරෙහි ඇති දේ පිළිබඳ වගකීම මාහට භාරගන්නේද? ඔහුට ස්වර්ගය පිළිබඳ වග කීම භාර ගනිමි. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[إن العبد ليتكلم بالكلمة ما يتبين فيها يزل بها في النار أبعد مما بين المشرق والمغرب] (رواه البخاري)

දාසයෙකු හොඳ හෝ නරක හෝ ගැන නොසිතා වචනයක් පිටත් කරයි. මෙමගින් ඔහු බටහිර හා නැගෙනහිර අතරට වඩා නුදුරින් අපායට වැටේ. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-දිවෙහි අනර්ථ හා එයින් වැළකී සිටීමේ අවශ්‍යතාවය. අල්ලාහ්ට එරෙහි මාර්ගයෙහි කෙනෙකු තම දිව භාවිතා කිරීම අපාය යෙහි පිවිසීමට අයත් කාරණාවලින් එකක් වනු සේම, නිශ්ච යෙන්ම ඔහු බරපතළකම නොසළකා පවසන වචනයකින් අපායයෙහි ලිස්සී වැටේ. එයින් රැක බලාගැනීම ස්වර්ගයට පිවිසීමෙහි කාරණාවලින් එකකි. මිනිසුන්හට අධික වරද්ද හා අමතකවීම් සිදුවීමට හේතුන් ලෙස පවතින්නේ, තම දිව අවශ්‍ය නොවන කතා බහක යෙදවීමකි.

2-නිශ්චය වශයෙන්ම, මිනිසා තම ප්‍රකාශ හා ක්‍රියාවන් පිළිබඳව ප්‍රශ්න කිරීමට ලක්වේ. නිශ්චයෙන්ම, මිනිස් අවයවන් අතර දිව හා යෝනිය ඉමහත් අනර්ථයෙකි.

# 17-කේළාම් කීමෙන් වැළකීම

කේළාම් කීමෙහි අනර්ථ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසයි.

﴿ولا يغتب بعضكم بعضا، أيحب أحدكم أن يأكل لحم أخيه ميتافكرهتموه﴾

[الحجرات: ١٢]

ඔබලාගෙන් සමහරුන් අන් සමහරුන් ගැන කේළාම් නොකි යන්න. ඔබලාගෙන් කවරෙකු හෝ නැසීගිය තම සහෝදරයාගේ මාංශය අනුභව කිරීමට කැමැති වන්නේද? (අකැමැතිවී) එයට ඔබලා අප්‍රියවන්නෝය. *(අල්කුර්ආන්-49:12)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

**[أتدرون ما الغيبة؟ قالوا: الله ورسوله أعلم، قال: ذكرك أخاك بما يكره، قيل أرأيت إن كان في أخي ما أقول ؟ قال: إن كان فيه ما تقول فقد اغتبته وإن لم يكن فيه ما تقول فقد بهته]** (رواه مسلم)

කේළාම් කීම යනු කුමක්ද බව ඔබලා දැන සිටින්නේද? යනු වෙන් (නබිතුමා) විමසීය. එයට ඔවුන් (සහාබාවරුන්) 'අල්ලාහ් හා ඔහුගේ දූතයාතමා මෙය දැන සිටින්නාය'. යනුවෙන් පැවසූහ. නබිතුමා 'එය ඔබ සහෝදරයා ගැන ඔහු අප්‍රියවන දේ කීමකි.' බව පැවැසීය. මා පවසන කරුණු මගේ සහෝදරයා වෙත තිබේ නම් ඒ ගැන කුමක් සිතන්නේද, යනුවෙන් ඇසීය. (එයට එතුමා) ඔබ පවසන දේ ඔහු මත තිබේනම් ඔබ නිශ්චයෙන්ම කේළාම් කිව්වේය. ඔබ පැවැසූ දේ ඔහු මත නොවන්නේනම් ඔබ ඔහුට දොස් පද කීවේය. යනුවෙන් පැවැසීය.

ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

**قلت للنبي ﷺ حسبك من صفية كذا وكذا فقال: [لقد قلت كلمة لو مزجت بماء البحر لمزجته]** (أبو داود)

මා නබි මුහම්මදු (සල්) තුමාගෙන් සෆියියා (රලි) තුමිය(ගේ මිටි තත්ත්වය ගැන අතින් සංඥා කරමින් ඇය) මෙසේ මෙසේ

සිටීම, ඔබතුමාට (ඇය ගැන ප්‍රශංසා කිරීම) ඇති බව පැවැසුවෙමි. එයට එතුමා 'නිශ්චය වශයෙන්ම ඔබ පැවැසූ වචනය මුහුදෙහි මිශ්‍රණය කළොතම් එම මුහුදම එයින් කැළඹේ.' යනුවෙන් පැවැසීය. *(අබුදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[كل المسلم على المسلم حرام دمه وعرضه وماله] (رواه البخاري ومسلم)

සෑම මුස්ලිම් වරුන්ටම මුස්ලිම් වරයෙකුගේ ලේ, නම්බුව (ගෞරවය) හා ධනය තහනම්ය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[من كان يؤمن بالله واليوم الآخر فليقل خيرا أو ليصمت] (سنن الترمذي)

කවරෙකු අල්ලාහ් හා අවසාන දිනය විශ්වාස කරමින් සිටින්නේද? ඔහු හොඳ දේ ප්‍රකාශ කරනු. නොඑසේනම්, නිශ්ශබ්දව සිටිනු. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ දර්දා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[من رد عن عرض أخيه رد الله عن وجهه النار يوم القيامة]

කවරෙකු තම සහෝදරයා අවනම්බුවීම වළක්වන්නේනම්, පර ලොව දිනයෙහි අල්ලාහ් ඔහුගේ මුහුණ අපායයෙන් වළක්වයි.

## ප්‍රයෝජන

1- කේළාම් කීම තහනම්ය. එය මහා පාප ක්‍රියාවලින් එකකි. කේළාම් කියන්නාට දුෂ්කර දඬුවම තිබේ.

2- යමෙකු සතුටු නොවන කරුණක් ගැන (එය ඔහු මත තිබේ හෝ නොතිබේ හෝ වේවා) ඔහු නොමැති අවස්ථාවක කේලාම් කීම තහනම්ය.

3- කේලාම් කියන්නා අප්‍රිය කිරීම හා එයින් ඔහු වළක්වාලීම. කේලාම් කීමට සවන්දීම තහනම්ය. මුස්ලිමෙකු අවනම්බුවට පත්වීම වළක්වීම ශ්‍රේෂ්ඨයෙකි. පරලොවෙහි එසේ වළක්වන්නාගේ මුහුණ අපායයෙන් වැළෙක්වේ.

4-කේලාම් කීම මිනිසුන් අප්‍රිය කරන දේ කීමෙන් හා සංඥා කිරීමෙන් සිදුවේ.

# 18-සත්‍යය හා අසත්‍යය

සත්‍යයේ ශ්‍රේෂ්ඨත්වය හා අසත්‍යයේ නින්දාව ගැන අල්ලාහ් මෙලෙස පවසන්නේය.

﴿إنما يفترى الكذب الذين لا يؤمنون بآيات الله، وأولئك هم الكاذبون﴾

[النحل: ١٠٥]

නිශ්චයවශයෙන්ම, ව්‍යාජ (අසත්‍ය තොරතුරු) පතුරුවන්නන් අල්ලාහ්ගේ වැකියන් විශ්වාස නොකරන්නන්ය. තවද, ඔවුන්මමා අසත්‍යකරුවන්ය. *(අල්කුර්ආන්-16:105)*

﴿يا أيها الذين آمنوا اتقوا الله وكونوا مع الصادقين﴾ [التوبة:١١٩]

විශ්වාසවන්තයිනි, අල්ලාහ්ට බියව(සිටි)න්න. තවද, සත්‍යකරුවන් සමග සිටින්න. *(අල්කුර්ආන්-9:119)*

﴿فلو صدقوا الله لكان خيرا لهم﴾ [محمد: ٢١]

ඔවුන් අල්ලාහ්ව සත්‍ය කළේනම්. එය ඔවුන්ට(ම) යහපත්ය. *(අල්කුර්ආන්-47:21)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව හසන් බින් අලී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[دع ما يريبك إلى مالا يريبك، فإن الصدق طمأنينة، والكذب ريبة]

(رواه الترمذى والنسائي)

ඔබට සැක පවතින දේ සියල්ල සැක නොපවතින දේ කරා අත් හරින්න. මක්නිසාදයත්, සත්‍යතාවය සැනසීමෙන්ද අසත්‍යතාවය නොසැනසීමෙන්ද පවතී. *(තිර්මිදී හා නසාඉ ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[إن الصدق يهدي إلى البر وإن البر يهدي إلى الجنة وإن الرجل ليصدق ويتحرى الصدق حتى يكتب عند الله صديقا، وإن الكذب يهدي إلى الفجور وإن الفجور يهدي إلى النار وإن الرجل ليكذب ويتحرى الكذب حتى يكتب عند الله كذابا] (متفق عليه)

නිශ්චයෙන්ම, සත්‍යතාවය යහපත කරා මග පෙන්වයි. නිශ්චයෙන්ම යහපත ස්වර්ගය කරා මග පෙන්වයි. නියත වශයෙන්ම, මිනිසෙකු සත්‍යය පවසයි. සත්‍යයම පැවැසීමට වෙහෙස දරයි. අවසානයේ ඔහු අල්ලාහ් වෙත ඉතා සත්‍යවන්තයා ලෙස සටහන් වේ. නිශ්චය වශයෙන්ම, අසත්‍යතාවය පාප ක්‍රියාවන් කරා මග පෙන්වයි. නිශ්චයවශයෙන්ම, අකුසල් ක්‍රියාවන් අපාය කරා මග පෙන්වයි. නිශ්චයෙන්ම, මිනිසෙකු අසත්‍යය පවසයි. අසත්‍යයම පැවැසීමට වෙහෙස දරයි. අවසානයේ ඔහු අල්ලාහ් වෙත මහා අසත්‍යවන්තයා ලෙසට සටහන්වේ. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් උමර් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[أربع من كن فيه كان منافقا خالصا، ومن كانت فيه خصلة منهن كانت فيه خصلة من النفاق حتى يدعها: إذا أؤتمن خان وإذا حدث كذب وإذا عاهد غدر وإذا خاصم فجر] (متفق عليه)

කවරෙකු මත ලක්ෂණ හතරක් තිබේද, ඔහු පැහැදිළි කුහක යාය. තවද, කවරෙකු මත මෙයින් ලක්ෂණයක් හෝ තිබී එය ඔහු අත් හරින තෙක් කුහකමේ එම ලක්ෂණය ඔහු මත පවතී. ඒවා, ඔහු විශ්වාස කළානම් ද්‍රෝහිකම් කරයි. ඔහු යමක් ප්‍රකාශ කළා නම් අසත්‍ය පවසයි. ඔහු ගිවිසුමක් කළානම් එය බිඳ දමයි. ඔහු තර්ක කළානම්, පාප ක්‍රියාවෙහි යෙදෙයි. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1- අසත්‍යය පැවැසීම පිළිබඳ අවවාදය. නිසැකයෙන්ම එය කුහක යන්ගේ ලක්ෂණයෙකි. මිනිසුන් අතර අසත්‍යය පතුරුවන්නා දුෂ්කර දඬුවමට ලක්වේ.

2- අසත්‍යය ප්‍රකාශ කිරීම අපායෙහි පිවිසීමට හේතුවන සේම, පාප කාර්යයන් කරා ඔහුව ඇදගෙන ඒවි.

3-සත්‍යතාවයේ විශේෂත්වය ගැන පැහැදිළිකර ඇත. සෑම කාර්ය යන් කෙරෙහිම එය උනන්දු කරවයි.

4-නියතවශයෙන්ම අසත්‍ය පැවැසීම කුහකමෙහි සළකුණුවලින් එකකි.

# 19-පාප ප්‍රහාණය

තව්බා නම්වූ පාප ප්‍රහාණය අයැදීම පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿و توبوا إلى الله جميعا أيه المؤمنون لعلكم تفلحون﴾ [النور:٣١]

විශ්වාසවන්තයිනි, ඔබ සැම දෙනා (එක් රැස්ව) අල්ලාහ් කරා පාප ප්‍රහාණය (තව්බා) අයැදින්න. ඔබලා ජය ලබාගැනීමට හැක. *(අල්කුර්ආන්-24:31)*

﴿يا أيها الذين آمنوا توبوا إلى الله توبة نصوحا﴾ [التحريم :٨]

විශ්වාසවන්තයිනි, අල්ලාහ් වෙත නිශ්කලංකයෙන් පාප ප්‍රහාණය (තව්බා) අයැදින්න. *(අල්කුර්ආන්-66:8)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අල් අගර් බින් යසාර් (රලි) තුමා මෙසේ පවසයි.

[يا أيها الناس توبوا إلى الله فإني أتوب في اليوم مائة مرة] (رواه مسلم)

මිනිසුනි, අල්ලාහ්ගෙන් පාප ප්‍රහාණය අයැදින්න. නියත වශයෙන්ම, මා දිනපතා වතාවන් සීයයක් (බැගින්) පාප ප්‍රහාණය අයැදින්නෙමි. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[الله أفرح بتوبة عبده من أحدكم سقط على بعيره وقد أضله في أرض فلاة]

(متفق عليه)

මහා වනාන්තරයේ තමාගේ ඔටුවාව නැති කළ (පසුව ඔහු එය සොයා ලබා ගත් විගස පත්වන) ඔබලාගෙන් කෙනෙකු(ගේ

සන්තෝෂය)ට වඩා අල්ලාහ් තම දාසයා අයැදින පාප ප්‍රහාණය ගැන සන්තෝෂ වන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[كل ابن آدم خطاء وخير الخطائين التوابون] (رواه الترمذي)

ආදම්ගේ පුත්‍රයන් (මිනිසුන්) සැම දෙනා වැරදි කරන්නන්ය. වැරදි කරන්නන් අතර ශ්‍රේෂ්ඨ වන්නයන් පාප ප්‍රහාණය අයැදින් නන්ය. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් උමර් බින් කත්තාබ් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[إن الله عز وجل يقبل توبة العبد مالم يغرغر] (رواه الترمذي وابن الماجة)

දාසයා 'ගිර් ගිර්' (පණ උගුරු දණ්ඩට සමීපවන) අවස්ථාවට ලක්වන තෙක් අල්ලාහ් ඔහුගේ පාප ප්‍රහාණය පිළිගනී. *(තිර්මිදී හා ඉබ්නු මාජා ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූමූසා අල්අෂ්අරි (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[إن الله تعالى يبسط يده بالليل ليتوب مسيء النهار ويبسط يده في النهار
ليتوب مسيء الليل حتى تطلع الشمس من مغربها] (رواه مسلم)

නියතවශයෙන්ම, දහවල් (කාලයෙ)හි පාපයන් කළ අය පාප ප්‍රහාණය අයැදීම සඳහා අල්ලහ් රාත්‍රියෙහි තම අත විවෘත කරයි. තවද, රාත්‍රි (කාල)යෙහි පාපයන් කළ අය පාප ප්‍රහාණය අයැදීම සඳහා අල්ලාහ් දහවල්හි තම අත විවෘත කරයි. මෙය ඉර බස්නා හිරෙන් උදාවන තෙක්ය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1- සෑම අවස්ථාවෙහිම පාප ප්‍රහාණය කිරීම අනිවාර්යවේ. පාප ප්‍රහාණය අයැදීම දාසයා ජයග්‍රහණය ලැබීමට හා නිදහස්වීමට හේතුවන සේම, කෙතරම් විශාල පාපයක් වුවද, පාප ප්‍රහාණය කළ හැක.

2-පාප ප්‍රහාණය කිරීමේ ශ්‍රේෂ්ඨය හා අල්ලාහ්ගේ කරුණාවේ විශාලය හා විශේෂය. නියතවශයෙන්ම,අල්ලාහ් පාප ප්‍රහාණය කරන්නා ගැන සන්තෝෂ වන්නේය.

3- නිශ්චයෙන්ම පාප කිරීම මිනිසුන්ගේ ස්වභාවයෙකි. එනමුත්, ඔහුගේ පාපයන් සඳහා පාප ප්‍රහාණය අයැදීම අනිවාර්යවේ.

## තව්බාවෙහි කොන්දේසි හා නීතිරීතීන්

1-පණ උගුර දණ්ඩට පැමිණ මරණය ලක්වීමට පෙර පාප ප්‍රහාණය කිරීම.

2-ඉර බස්නාහිරෙන් පිටවීමට පෙර පාප ප්‍රහාණය කිරීම. එසේ පිටවීමෙන් පසු කරන පාප ප්‍රහාණය එළ නොකෙරේ.

3-නිශ්චයෙන්ම, යමෙකු යම් පාප ක්‍රියාවක් සඳහා සත්‍යයෙන්ම පාප ප්‍රහාණය කළ පසු එම පාප ක්‍රියාව නැවත කළේද, නියත වශයෙන්ම ඔහුගේ පෙර පාප ප්‍රහාණය පිළිගෙනේ. එනමුත්, පසු කළ පාප ක්‍රියාව සඳහා නැවත පාප ප්‍රහාණය කළ යුතුයි.

4-පාප ක්‍රියාවන් අතහැරීම, සිදුවූ පාප ක්‍රියාවන් ගැන කණගාටු වීම හා එය නැවත නොකිරීමට අධිටන්වීම.

# 20-සලාමය පැතිරවීම

සලාමයෙහි විශේෂය හා වැදගත්කම පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿يا أيها الذين آمنوا لا تدخلوا بيوتا غير بيوتكم حتى تستأنسوا وتسلموا على أهلها﴾ [النور: ٢٧]

විශ්වාසවන්තයිනි, ඔබලාගේ නිවැස් හැර අන් නිවැස්වල එහි අයිතිකරුවන්ගේ අනවසරයෙන්ද හා සලාමය නොපවසමින්ද නොපිවිසෙන්න. *(අල්කුර්ආන්-24:27)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෙයිරා (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[لا تدخلون الجنة حتى تؤمنوا، ولا تؤمنوا حتى تحابوا، أولا أدلكم على شيء إذا فعلتموه تحاببتم ؟ أفشوا السلام بينكم] (رواه مسلم)

ඔබලා විශ්වාස කරන තෙක් ස්වර්ගයෙහි පිවිසීමට නොහැක. ඔබලාගෙන් කෙනෙක් අන් තැනැත්තා ප්‍රිය කරනතුරු විශ්වාස වන්තයන් වීමට නොහැක. මා ඔබලාට දෙයක් දැනුම් දෙන්නේද? එය ඔබලා ක්‍රියා කරන්නේනම්, ඔබලාගෙන් කෙනෙකු අන් තැනැත්තා ප්‍රිය කරයි. (එය) ඔබලා අතරෙහි සලාම් කීම පතුරු වීමකි'. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන්දුන් බව අබ්දුල්ලාහ් බින් සලාම් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[يا أيها الناس! أفشوا السلام، وأطعموا الطعام، وصلوا الأرحام، وصلوا بالليل والناس نيام، تدخلوا الجنة بسلام] (رواه الترمذي وابن ماجة)

මිනිසුනි, සලාමය පතුරුවන්න. ආහාරය සපයන්න. ඥාතීන් සමග එක්ව සිටින්න. රාත්‍රියේ මිනිසුන් (තද) නින්දෙහි පසුවන සමයේ ඇදහීමයෙහි යෙදෙන්න. ඔබ නිදහසෙන්ම ස්වර්ගයෙහි පිවිසේ. *(තිර්මිදී හා ඉබ්නු මාජා ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[إذا انتهى أحدكم إلى مجلس فليسلم، فإن بدا له أن يجلس فليجلس، ثم إذا قام فليسلم فليست الأولى بأحق من الآخرة] (رواه أبو داود والترمذي)

ඔබලාගෙන් කවරෙකු හෝ යම් සභාවක් කරා පැමිණියේනම්, ඔහු සලාම් කියතු. එහි අසුන් ගැනීමට ඔහු සිතන්නේනම්, අසුන් ගනු. පසුව නැගිට යන්නේනම්, සලාම් කියතු. අවසානයට වඩා ප්‍රථමය ඉමහත් උතුම්දායක නොවන්නේය. *(අබූදාවූද් හා තිර්මිදි ග්‍රන්ථ ඇසුරෙනි)*

## නීතිරීතීන්

1-සලාම් කීමෙහි විශේෂය, එය ස්වර්ගයෙහි පිවිසීමට හේතුදායක වන ආදරයට හේතුවෙකි.

2-හඳුනන හා නාඳුනන මුස්ලිම්වරුන්ට සලාම් කීම සතුටුදායක කරුණකි. සලාම් කීම හඳුනන අයට පමණක් නොවන්නේය.

3-සලාමයෙහි සතුටුදායක වැකිය 'අස්සලාමු අලයිකුම්' යන්නේය. 'වරහ්මතුල්ලාහි' යනුවෙන් වැඩිකර පැවැසීම සතුටුදායකවේ. 'වරහ්මතුල්ලාහි වබරකාතුහු' යනුවෙන් වැඩිකර පැවැසීම ඉතාමත් සතුටුදායකවේ. සලාමයට එසේම පිළිතුරු දීම අනිවාර්යවේ. එයට වඩා වැඩියෙන් පිළිතුරු දීම සතුටුදායකවේ.

4-ප්‍රථමයෙන් කාෆිර්වරුන්ට සලාමය ආරම්භ කිරීම තහනම්ය. කාෆිර්වරුන් අපහට සලාමය පවසන්නේනම්, 'වඅලයිකුම්' යනුවෙන් කිව යුතුයි.

5-එක හමුවක මුස්ලිම්වරුන් හා කාෆිර්වරුන් (එකට) සිටියේද, ඔවුන්ට සලාමය (පොදුවෙන්) කිව හැක.

6- මුස්ලිම්වරුන් දෙන්නෙකු වෙන්වී සුලු මොහොතකට පසු නැවත හමුවනවිට සලාම් කීම සතුටුදායක ක්‍රියාවකි.
7-නිවැස් හිමීන්ගේ අනවසරයෙන් නිවැස්තුලපිවිසීම තහනම්ය.

# 21-ආහාර අනුභව කිරීමේ පිළිවෙල්

මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

[إذا أكل أحدكم طعاما فليقل بسم الله، فإن نسي في الأول فليقل في الآخر (حين يذكر) بسم الله أوله وآخره] (رواه الترمذي وابن ماجة)

ඔබලාගෙන් කවරෙකු හෝ ආහාර අනුභව කරන අවස්ථාවේ 'බිස්මිල්ලාහ්' යනුවෙන් කියනු. එසේ ආරම්භයේ උසුරීමට අමත කවුයේද, (මතක්වූ විට) 'බිස්මිල්ලාහි ෆී අව්වලිහි වආ(ක්)හිරිහි' යනුවෙන් කියනු. *(තිර්මිදි හා ඉබ්නු මාජා ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා තමාට පැවැසූ බව උමර් බින් අබූ සලමා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[سم الله وكل بيمينك وكل مما يليك] (متفق عليه)

අල්ලාහ්ගේ නාමය උසුරන්න. ඔබ දකුණු අතින් (ආහාර) අනුභව කරන්න. ඔබ සමීප යේහි ඇති දේ (පමණක්) අනුභව කරන්න. (බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[لا يأكلن أحد منكم بشماله ولا يشربن بها فإن الشيطان يأكل بشماله ويشرب بها] (رواه مسلم)

ඔබලාගෙන් කවරෙකු හෝ තම වමතින් ආහාර අනුභව කිරීම හෝ පානය කිරීම හෝ නොකළ යුතුයි. කුමක්නිසාදයත්, නියත වශයෙන්ම, ෂෛතාන් (යක්ෂයා) වමතින් අනුභව හා පානය කරයි. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

අබූ හුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[ما عاب رسول الله ﷺ طعاما قط، إن اشتهاه أكله وإن كرهه تركه] (متفق عليه)

නබි මුහම්මදු (සල්) තුමා කිසියම් ආහාරයක් විවේචනය නොකරන්නේය. එතුමා කැමැති වුවද අනුභව කරන්නේය. අකැමැති වුවද (අනුභව නොකර) වළක්වා සිටින්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-ආහාර පාන අනුභව කිරීමේදී 'බිස්මිල්ලාහ්' උසුරීම සතුටුදායක කරුණකි. කවරෙකුට හෝ බිස්මිල්ලාහ් උසුරීමට අමතකවී අනුභව කරන අතරෙහි එය සිහිවන විට එය උසුරිය යුතුයි. එසේම මුස්ලිම්වරයා තමා ආහාර අනුභව කළායින් පසු 'අල් හම්දුලිල්ලා හිල්ලදී අත්අමනී හාදා වරසකනීහි මින් (ග්)හයිරි හව්ලින් මින්නී වලා කුව්වතින්' යනුවෙන් උසුරීම සතුටුදායක ක්‍රියාවෙකි.

2-වමතින් අනුභව කිරීම තහනම්ය. නිශ්චයෙන්ම එසේ අනුභව කිරීම ෂෛතාන්ට සමාන වීමකි. නමුත්, නොවැළක්විය අවස්ථාවක වමතින් අනුභව කළ හැක.

3-ආහාරයන් පිළිබඳව විවේචනය නොකිරීම සුන්නත්ය. එනිසා, ඔහු කැමැතිනම්, අනුභව කළ හැක. අකැමැතිනම්, වැළකී සිටිය හැක. ඒ පිළිබඳව දැනුම්දීම සඳහානම් අඩුපාඩු ගැන කීමට හැක.

# 22-මල මූත්‍රා පහකිරීම

අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[كان النبي ﷺ إذا دخل الخلاء قال: اللهم إني أعوذ بك من الخبث والخبائث] (متفق عليه)

නබි මුහම්මදු (සල්) තුමා වැසිකිළියට පිවිසවිට 'අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් (ක්)හුබුදි වල් (ක්)හබාඉදි'

(තේරුම : දෙවියනේ, මා ඔබෙන් (පිරිමි හා ස්ත්‍රී) ෂෛතාන් වරුගේ උවදුරුවලින් ආරක්ෂාව පතමි) යනුවෙන් උසුරන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

[أن رسول الله ﷺ كان إذا خرج من الغائط قال: غفرانك] (أخرجه الخمسة)

නබි මුහම්මදු (සල්) තුමා (මල මූත්‍රා පහකර) වැසිකිළියෙන් පිටත්වන විට 'ගුෆ්රානක' (තේරුම: දෙවියනේ මා ඔබෙන් සමාව අයැදින්නෙමි) යනුවෙන් උසුරන්නේය. *(තිර්මිදී, ඉබ්නු මාජා, අබූදාවූද්, නසාඉ හා අහ්මද් යන ග්‍රන්ථ (පහ) ඇසුරෙනි)*

ජාබිර් බින් අබ්දුල්ලාහ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[أن رسول الله ﷺ وسلم نهى أن يبال في الماء الراكد] (رواه مسلم)

නිශ්චය වශයෙන්ම, නබි මුහම්මදු (සල්) තුමා රැඳී සිටින ජල යෙහි මූත්‍රා පහ කිරීම තහනම් කළාය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-මුස්ලිම්වරයා වැසිකිළියට පිවිසෙන විට 'අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් (ක්)හුබුදි වල් (ක්)හබාඉදි' යනුවෙන්ද, එයින් පිටත්වන විට 'ගුෆ්රානක' යනුවෙන්ද උසුරීම සතුටුදායක කාර්යයෙකි.

2-මිනිසුන්ගේ පෙනීමෙන් (වැළකීමට) තම ආවරණ ප්‍රදේශ ආවරණය කිරීම අනිවාර්යවේ. ගොඩනැගිල්ලකින් පිටත මල මූත්‍රා පහ කිරීමේදී කිබ්ලා දිසාවට අභිමුඛව හෝ පසුමූඛව හෝ නොසිටීමට උනන්දුවීම අනිවාර්යවන සේම, මලමූත්‍රා පහ කිරීමේදී මිනිසුන්ගෙන් ඈත්වී සැඟව සිටීම සතුටුදායක කරුණෙකි.

3- මල මූත්‍රා පහකිරීමේදී අවධානමෙන් සිටීමටද, එයින් පසු පිරි සිදු කිරීමටද උනන්දුවීම අනිවාර්යවේ.

4- ඉස්ලාම් ධර්මය මලමූත්‍රා පහ කිරීමේ පිළිවෙල් ඇතුලු සියලු කාර්යයන් ඇතුලත්කොට පැහැදිලි කිරීම කරා අවධානය යොමු කරනවිට මෙම ධර්මය පරිපූරණ ධර්මයක් බවට පැහැදිලිවේ.

# 23-කිඹිසීම හා ඇණුම

නබි මුහම්මදු (සල්) තුමා පැවැසු බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරයි.

[إن الله يحب العطاس ويكره التثاؤب، فإذا عطس أحدكم وحمد الله كان حقا على كل مسلم سمعه أن يقول له يرحمك الله، فأما التثاؤب فإنما هو من الشيطان، فإذا تثاءب أحدكم فليرده مااستطاع فإن أحدكم إذا تثاءب ضحك منه الشيطان] (رواه البخاري)

නිශ්චයවශයෙන්ම, අල්ලාහ් කිඹිසීම ප්‍රිය කරයි. ඇණුම අප්‍රිය කරයි. ඔබලාගෙන් කවරෙකු හෝ කිඹුහුමක් යවා 'අල්හම්දු ලිල්ලාහ්' යනුවෙන් අල්ලාහ්ව ප්‍රශංසා කළේද, එයට සවන් දෙන සෑම මුස්ලිම්වරයාම 'යර්හමුකල්ලාහ්' යනුවෙන් කීම අනිවාර්ය වේ. නමුත්, ඇණුම ඇරීම නිශ්චයෙන්ම ෂෛතාන්ගේ මාර්ගයෙන් සිදුවන එකකි. එහෙයින්. ඔබලාගෙන් කවරෙකුට හෝ ඇණුම පිටවෙන්නේනම්, එය හැකිතාක් වළකින්න. තවද, ඔබලාගෙන් කෙනෙකු ඇණුම අරින විට ඔහු බලා ෂෛතාන් සිනහවෙමින් සිටින්නේය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි (සල්) තුමා පැවැසූ බව අබූ හුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[إذا عطس أحدكم فليقل :الحمد لله وليقل أخوه أوصاحبه : يرحمك الله،

فإذا قال: يرحمك الله فليقل : يهديكم الله ويصلح بالكم] (رواه البخاري)

ඔබලාගෙන් කෙනෙකු කිඹුහුමක් යැව්වේද, ඔහු 'අල්හම්දු ලිල්ලාහ්' යනුවෙන්ද, (එයට සවන්දෙන) ඔහුගේ සහෝදරයා හෝ මිත්‍රයා 'යර්හමුකල්ලාහ්' යනුවෙන්ද කිව යුතුයි. එසේ යර්හමු කල්ලාහ් යනුවෙන් පැවැසුවේද, ඔහු (කිඹුහුම යැවූ තැනැත්තා) යහ්දිකුමුල්ලාහ් වයුස්ලිහ් බාලකුම් යනුවෙන් කිව යුතුයි. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව අබූ මූසා (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

[إذا عطس أحدكم فحمد الله فشمتوه، فإن لم يحمد الله فلا تشمتوه]

(أخرجه مسلم)

ඔබලාගෙන් කෙනෙකු කිඹුහුමක් කර, අල්හම්දු ලිල්ලාහ් යනු වෙන් පැවැසුවේද, ඔහුට පිළිතුර කියන්න. ඔහු අල්හම්දු ලිල්ලාහ් නොපැවැසුවේද, ඔහුට පිළිතුර නොකියන්න. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

අබූ හුරෙයිරා (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[أن النبي ﷺ كان إذا عطس غطى وجهه بيده أو بثوبه وغض بها صوته]

(أخرجه أحمد والترمذي وأبو داود)

නිශ්චයෙන්ම, නබි මුහම්මදු (සල්) තුමා කිඹිසීමක් කළානම්. තම අතින් හෝ රෙද්දකින් හෝ මුහුණ වසා ගනී. එමගින් තම ශබ්දයද පහත්කර ගනී. *(අහ්මද්, තිර්මිදී හා අබූදාවූද් ග්‍රන්ථ ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-කිඹිසීමක් කරන්නා අල්හම්දුලිල්ලාහ් යනුවෙන් උසුරීමට සවන් දෙන සැම දෙනා යර්හමුකල්ලාහ් යනුවෙන් කීම සතුටුදායක කරුණකි.

2-ඔහු අල්හම්දු ලිල්ලාහ් නොකීවේද, යර්හමුකල්ලාහ් යනුවෙන් නොකිව යුතුයි.

3-ඇණුම ඇරීමෙන් වැළකීම හා මුඛය වසාගැනීම සතුටුදායක කරුණෙකි.

4-ඇණුම ඇරීමේදී අත මුඛය මත තබාගැනීම සතුටුදායක කරුණෙකි.

5-කිඹිසීම කරන අවස්ථාවෙහි රෙද්දකින් හෝ අතින් හෝ අත් පිසුමකින් හෝ මුහුණ වසා ගැනීම සතුටුදායක කරුණෙකි.

6-කිඹිසීම කරන හෝ ඇණුම අරින අවස්ථාවේ එහි ශබ්දය වැඩි කිරීම අසතුටුදායක කරුණෙකි.

# 24-බල්ලන් ඇතිකිරීම

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බවඅබූ හුරෛරා (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

[من اتخذ كلبا إلا كلب ماشية أو صيد أو زرع إنتقص من أجره كل يوم قيراط] (متفق عليه)

කවරෙකු සිව්පාවන් (මේච්චල් කිරීම) හෝ දඩයම් (කිරීම) හෝ කෘෂිකර්මය (ආරක්ෂා කිරීම) යනාදී කාරණාවෙන් තොරව බල්ලෙකු ඇති කරන්නේනම්, (ඒ සඳහා) සැම දිනක්ම ඔහුගේ කුලියෙන් කීරාතයක් අඩුකරනු ලැබේ. *(බුහාරී හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

[إذا ولغ الكلب في إناء أحدكم فاغسلوه سبعا وعفروه الثامنة بالتراب] (رواه مسلم)

ඔබලාගෙන් කෙනෙකුගේ භාජනයෙහි බල්ලෙකු තම දිව දිගු කරමින් ජලය පානය කළේනම්, එය හත් වරක් සෝදා පිරිසිදු කරන්න. අටවෙනි වර පස් සමග (සෝදා පිරිසිදු කර) සම්පූර්ණ කරන්න. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

## **ප්‍රයෝජන**

1-දඩයම් කිරීම හෝ සිව්පාවන් රැක බලා ගැනීම හෝ කෘෂිකර්මාන්ත ආරක්ෂාකර ගැනීම යනාදි කාරණාවෙන් තොරව බල්ලන් ඇති කිරීම තහනම්ය.

2-බල්ලන්ගෙන් ඈත්වී සිටීමට හා බල්ලන්ගෙන් වැළකී සිටීමට අණ කිරීම.
3-බල්ලා භාජනයතුල තම දිව දිගු කරමින් ජලය පානය කළේද, එය හත්වරක් සෝදාගත යුතු අතර, එයින් එක් වරක් (හෝ මීළඟ වතාව) පස් යොදා සෝදා පිරිසිදු කිරීම.

# 25-අල්ලාහ් සිහි (දික්ර්) කිරීම

අල්ලාහ්ව සිහිකිරීම (දික්රුල්ලාහ් - භාවනා කිරීම) පිළිබඳව ඔහු මෙසේ පවසන්නේය.

﴿واذكروا الله كثيرا لعلكم تفلحون﴾ [الجمعة : ١٠]

ඔබලා ජයග්‍රහණය ලබාගැනීම සඳහා අල්ලාහ්ව අධිකව භාවනා කරන්න. *(අල්කුර්ආන්-62:10)*

﴿يا أيها الذين آمنوا اذكروا الله ذكرا كثيرا، وسبحوه بكرة وأصيلا﴾ [الأحزاب :٤١،٤٢)

විශ්වාසවන්තයිනි, අධික භාවනා කිරීම මගින් අල්ලාහ්ව සිහි කරන්න. තවද, උදේ හා සවස ඔහුව ප්‍රශංසා කරන්න. *(අල්කුර් ආන්-33:41,42)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූමූසා අල්අෂ්අරී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[مثل الذي يذكر ربه والذي لا يذكر ربه مثل الحي والميت] (متفق عليه)

තම දෙවියා සිහිකර සිටින්නා හා තම දෙවියා සිහි නොකර සිටින්නා, පණ ඇති හා පණ නැති අයට උදාහරණයකි. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෙයිරා (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[كلمتان خفيفتان على اللسان، ثقيلتان بالميزان، حبيبتان إلى الرحمن:

سبحان الله وبحمده سبحان الله العظيم] (متفق عليه)

දිවට (පැවැසීමට) පහසුවන, තරාදියට (කුසලින්) බරවන හා රහ්මාන්ට (අල්ලාහ්ට) ප්‍රියවන වචන දෙකක් වන්නේ සුබ්හානල් ලාහි වබිහම්දිහි, සුබ්හානල්ලාහිල් අලීම් යන්නේය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෙයිරා (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[لئن أقول سبحان الله، والحمد لله، ولا إله إلاالله، والله أكبر، أحب إلي مما

طلعت عليه الشمس] (رواه مسلم)

සුබ්හානල්ලාහි වල්හම්දු ලිල්ලාහි වලාඉලාහ ඉල්ලල්ලාහු වල්ලාහු අක්බර් යනුවෙන් මා උසුරීම, ඉර කුමණ දේ මත උදා වෙන්නේද, ඒ සියල්ලන්ටම වඩා මාහට ඉමහත් ප්‍රිය ලබා දෙන් නෙකි. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව ජාබිර් (රළි) තුමා මෙසේ පවසන්නේය.

[أفضل الذكر لا إله إلا الله] (رواه الترمذي)

ලාඉලාහ ඉල්ලල්ලාහ් භාවනාවලින් ශ්‍රේෂ්ඨමත් භාවනාවකි. *(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

# තෝරාගන්නාලද (දික්ර්) උසුරිම්

1-නින්දට යනවිට ඃ

بسمك اللهم أموت وأحيا - බිස්මිකල්ලාහුම්ම අමූතු වඅහ්යා

2-නින්දෙන් අවදිවූවිට ඃ

الحمد لله الذي أحيانا بعد ما أماتنا وإليه النشور

අල්හම්දු ලිල්ලාහිල්ලදී අහ්යානා බඃද මා අමාතනා වඉලයිහින් නුෂූර්

3-ගමනෙහි යෙදෙනවිට ඃ

بسم الله، الحمد لله، سبحان الذي سخر لنا هذا

وما كنا له مقرنين، وإنا إلى ربنا لمنقلبون

බිස්මිල්ලාහි, අල්හම්දු ලිල්ලාහි, සුබ්හානල්ලදී සක්හරලනා හාදා වමා කුන්නා ලහූ මුක්රිනීන්. වඉන්නා ඉලා රබ්බිනා ලමුන්කලිබූන්.

4-ස්ථානයක බැස්සවිට ඃ

أعوذ بكلمات الله التامات من شر ما خلق

අඌදු බිකලිමාතිල්ලාහි තාම්මාත් මින් ෂර්රි මා ක්හලක්.

5-දෝවනය කිරීමට පෙර ඃ

බිස්මිල්ලාහ් - بسم الله

6-දෝවනය කිරීමෙන් පසු ඃ

أشهد أن لاإله إلا الله وحده لا شريك له وأشهد أن محمدا عبده ورسوله

අෂ්හදු අල්ලාඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීක ලහූ වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහූ වරසූලුහු.

7-නිවසින් පිටත්වන විට ඃ

بسم الله توكلت على الله ولا حول ولا قوة إلا با لله

බිස්මිල්ලාහි තවක්කල්තු අලල්ලාහි වලා හවල වලා කුව්වත ඉල්ලා බිල්ලාහි.

8-නිවස තුල පිවිසන විට ඃ

بسم الله ولجنا، وبسم الله خرجنا، وعلى ربنا توكلنا

බිස්මිල්ලාහි වලජ්නා, ව බිස්මිල්ලාහි ක්හරජ්නා, වඅලා රබ්බිනා තවක්කල්නා.

9-නබිතුමාට උදුරන සලවාතය ඃ

اللهم صل على محمد وعلى آل محمد كما صليت على إبراهيم وعلى آل إبراهيم إنك حميد مجيد، اللهم بارك على محمد وعلى آل محمد كما باركت على إبراهيم وعلى آل إبراهيم إنك حميد مجيد

අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා සල්ලයිත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්. අල්ලාහුම්ම බාරික් අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා බාරක්ත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්.

10-උදැසන සමයේ ඃ

اللهم بك أصبحنا وبك أمسينا، وبك نحيا وبك نموت، وإليك النشور

අල්ලාහුම්ම බික අස්බහ්නා වබික අම්සයිනා, වබික නහ්යා වබික නමූතු, වඉලයිකන්නුෂූර්.

11-සවස් වරුවේ ඃ

اللهم بك أمسينا وبك أصبحنا، وبك نحيا وبك نموت، وإليك المصير

අල්ලාහුම්ම බික අම්සයිනා වබික අස්බහ්නා, වබික නහ්යා වබික නමූතු, වඉලයිකල්මසීර්.

# 26-මිත්‍රයා

මිත්‍රත්වය කිරීම පිළිබඳව අල්ලාහ් අල්කුර්ආනයෙහි මෙලෙස පවසන්නේය.

﴿ الأخلاء يومئذ بعضهم لبعض عدو إلا المتقين﴾ [الزخرف :٦٧]

බියභක්තිකයන් හැර, එදින මිත්‍රයන්ගෙන් සමහරුන් සමහරයන්ට විරුද්ධවාදීන් ලෙස සිටිති. *(අල්කුර්ආන්-43: 67)*

﴿ويوم يعض الظالم على يديه يقول ياليتني اتخذت مع الرسول سبيلا، ياويلتى ليتنى لم اتخذ فلانا خليلا، لقد أضلني عن الذكر بعد إذ جاءني، وكان الشيطان للإنسان خذولا﴾ [الفرقان :٢٧-٢٩]

එම (අවසාන) දිනයේ අපරාධකරුවා තම දැත් හපාගෙන 'එම දූතයා සමග මාද (යහපත්) මාර්ගයෙහි නොසිටියේ නැතැ? යනුවෙන් පවසයි. මාහට සිදුවූ අපලයෙන්, (මා අයහමගට යොමු කළ) කෙනෙකු මිත්‍රයා නොකරමින් සිටියේ නැතැ? නියතවශයෙන්ම, මාහට යහපත් දේශනා ලැබීමෙන් පසුද ඔහු මාව අයහමගට යොමු කළානේ? තවද, ෂෛතාන් මිනිසාට දැඩි ලෙස කුමන්ත්‍රණ කරන්නෙකු ලෙස සිටී. (යනුවෙන් අඩා වැළපී සිටී) *(අල්කුර්ආන් -25: 27-29)*

﴿ فأقبل بعضهم على بعض يتساء لون، قال قائل منهم إني كان لي قرين ، يقول أئنك لمن المصدقين، ءإذامتنا وكنا ترابا وعظاما ء إنا لمدينون، قال هل أنتم مطلعون، فاطلع فرآه في سواء الجهيم، قال تالله إن كدت لتردين، ولولا نعمة ربى لكنت من المحضرين ﴾ [الصفات : ٥٠-٥٧]

(එවිට) ඔවුන්ගෙන් සමහරුන් (අන්) සමහරුන්ට අභිමුඛව සිට කතාබහ කරමින් සිටිති. ඔවුන්ගෙන් කෙනෙකු 'මාහට (මෙලොවෙහි) ප්‍රිය මිත්‍රයෙකු සිටි බවත්, නිශ්චයෙන්ම, ඔහු (මරණයට පසු නැවත පණදීම) සත්‍ය බවට පිළිගන්නා අයගෙන් ඔබත් කෙනෙකුද? යනුවෙන් ඇසූ බවත්' පවසයි. 'අපි නැසී ගොස් පස් හා ඇට කටු ලෙස පත්වීමෙන් පසු (නැවත පණදී) කුලිය ලැබෙන්නෙමුද?' (යනුවද ඇසීය. එසේ පැවැසූ) ඔහුව ඔබලා දිටීමට කැමැති වන්නේද? යනුවෙන්ද පවසයි. ඔහු (පහළ දෙස කරා) බැලුවේය. ඔහුව අපායයෙහි මැද දිටීය. (ඔහුගෙන්) අල්ලාහ් මත දිවුරා කියමි, ඔබ මාව විනාශ කිරීමට වෙහෙස දැරුවානේ?' මාගේ දෙවියාගේ භාග්‍යය නොවන්නේනම්. මාද (අපායට) ගෙනා අයගෙන් කෙනෙකුවී සිටියෙමි. *(අල්කුර්ආන්- 37: 50-58)*

නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[الرجل على دين خليله فلينظر أحدكم من يخالل] (رواه أبو داود والترمذي)

මිනිසා තම මිත්‍රයාගේ ධර්මයෙහි සිටී. එහෙයින්, ඔබලාගෙන් යමෙකු කවරෙකු සමග මිත්‍රත්වය පැවැත්විය යුතුද යන්නෙහි සිය අවධානය යොමු කළ යුතුයි. *(අබූදාවූද් හා තිර්මිදි ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[سبعة يظلهم الله في ظله يوم لا ظل إلا ظله...ورجلان تحابا في الله اجتمعا عليه وتفرقا عليه] (متفق عليه)

අල්ලාහ්ගේ සැවනැල්ල හැර අන් කිසියම් සැවනැල්ලක් නොමැති දිනයේ අල්ලාහ් තම අර්ෂයේ සැවනැල්ලෙහි හත් දෙනෙකුට සැවනැල්ල ලබා දෙයි. ඔවුන්ගෙන් කෙනෙක් අල්ලාහ් වෙනුවෙන් ප්‍රියකර ඒ අනුව මිත්‍රවී හා ඒ අනුව වෙන්වූ මිතිසුන් දෙන්නා. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

## ප්‍රයෝජන

1-සෑම මිනිසෙකුටම මිත්‍රයෙක් අවශ්‍යයයි. එබැවින් යහපත් කාර්‍යයන් වටහාදී ඒ අනුව උපකාර කරන යහපත්ශීලි මිත්‍ර යෙකු ලබා ගැනීමට උනන්දු විය යුතුයි.

2-නියතවශයෙන්ම, මිත්‍රයා සමහර අවස්ථාවක පාප ක්‍රියාවන් හා අල්ලාහ්ව ප්‍රතික්ෂේප කිරීම කරා සමීප කරන්නෙකු ලෙස සිටියේද ඔහු ඉතා දුෂ්ට විරෝධියෙකුවේ.

3-ප්‍රතික්ෂේප කරන්නන් සමග මිත්‍රත්වය පැවැත්වීම පිළිබඳ අව වාදය. කුමක්නිසාදයත්, ඔවුන් මුස්ලිම්වරුන් අල්ලාහ්ට වැඳුම් පිදුම් කිරීම හා යහපත් ක්‍රියාවන්හි යෙදීම වළක්වති.

# 27-ඉවසීම

ඉවසීම පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿يا أيها الذين آمنوا اصبرو وصابروا...﴾ [آل عمران:٢٠٠]

විශ්වාසවන්තයිනි, ඉවසීමෙන් සිටින්න. (හිරිහැරයෙන්) ඉව සීලිමත්වන්න. *(අල්කුර්ආන්-3:200)*

﴿ولنبلونكم بشيء من الخوف والجوع ونقص من الأموال والأنفس والثمرات، وبشر الصابرين﴾ [البقرة:١٥٥]

නිශ්චයෙන්ම, අපි ඔබලා ස්වල්ප බියෙන්ද කුස ගින්නෙන්ද, ධනය, ජීවිත හා අස්වැන්න යනාදියෙන්ද පරීක්ෂා කරන්නෙමු. නමුත්, (නබිතුමනී) ඉවසිලිවන්තයන්හට ඔබ සුභාරංචි පතන්න. *(අල්කුර්ආන් -2:155)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ෂුහයිබ් බින් සිනාන් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[عجبا لأمر المؤمن إن أمره كله له خير، إن أصابته سراء شكر فكان خيرا له، وإن أصابته ضراء صبر فكان خيرا له] (رواه مسلم)

විශ්වාසවන්තයන්ගේ කාර්‍යයන් පිළිබඳව මා ඉමහත් ප්‍රීතියට පත්වෙමි. කාර්‍යයන් සියල්ල ඔහුට යහපත්ව පවතී. ඔහුට සතුටු වන කාර්‍යයක් සිදුවුවද, ඔහු තුති පුද කරයි. එය ඔහුට යහපත් ලෙස පවතින්නේය. ඔහුට සතුට නොවන කාර්‍යයක් සිදුවුවද, ඔහු එය ඉවසාගෙන සිටී. එය ඔහුට යහපත් ලෙස පවතින්නේය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව අනස් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[إن الله عز وجل يقول : إذا ابتليت عبدي بحبيبتيه فصبر عوضته منهما الجنة] (رواه البخاري)

'මාගේ දාසයාට, ඔහු ඉතාමත්ම ප්‍රිය කරන (ඇස්) දෙකක් (නොදීම) මගින් ඔහුව පරීක්ෂාවට ලක්කොට ඔහු එය ඉවසමින්

සිටින්නේනම්, ඒ දෙක වෙනුවට ස්වර්ගය මා ලබා දෙන්නෙමි.' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරයි.

**[ما يصيب المسلم من نصب ولا وصب ولاهم ولا حزن ولا أذى ولا غم، حتى الشوكة يشاكها إلا كفر الله بها من خطاياه]** (رواه البخاري ومسلم)

මුස්ලිම් වරයෙකුට දුෂ්කරතාවය, ලෙඩ, කම්පනය, ශෝකය, වේදනාව හා පාදයෙහි කටුටක් ඇණීම යනාදි පීඩාවන් සිදුවූවද නිශ්චයෙන්ම අල්ලාහ් එමගින් ඔහුගේ පාපයන් මකා විනාශ කරයි. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)*

නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

**[ما يزال البلاء بالمؤمن والمؤمنة في نفسه وفي ولده وماله حتى يلقى الله وما عليه خطيئة]** (رواه الترمذي)

විශ්වාසනීය පුරුෂ හා ස්ත්‍රීන්ගේ ආත්මාව, දරුවා හා ධනය යනාදියෙහි පරීක්ෂාවන් අඛණ්ඩව පවතී, එහි අවසානයේදී ඔවුන් (ඉවසීමෙන් තම පාපයන් මැකී විනාශවී) කිසියම් පාපයෙන් තොරව අල්ලාහ්ව බැහ දකී. *(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

## <u>ප්‍රයෝජන</u>

1-සෑම කාර්‍යයන් කෙරෙහි ඉවසීම උනන්දුකර ඇත. කෝපවීම වේදනාවෙහි (ඉවසීමෙන් ලැබෙන) කුලිය ඉවත් කරන බැවින් කෝපවීම ගැන අවවාදකර ඇත.

2-නිශ්චය වශයෙන්ම, මුස්ලිම්වරයෙකු ලක්වන වේදනාව මගින් ඔහුගේ පාපයන් මැකී විනාශ වන්නේය.
3-අවනතවීමෙහි හා පාපයෙන් වැළකීමෙහි ඉවසා සිටීම ඉවසීම් වලින් උතුම් ඉවසීමකි.
4-මුස්ලිම්වරයෙකු අල්ලාහ් තමා වෙනුවෙන් බෙදා ඇති දේ ගැන සෑහීමට පත්විය යුතුයි.

නිසැකයෙන්ම, අල්ලාහ් සියල්ල දැන සිටින්නා හා සූක්ෂම ඥානවන්තයාය. ඔහු දාසයන්ගේ සාදක පාදකයන් ඉතාමත් දැන සිටින්නාය.

**وصلى الله على نبينا محمد وعلى آله وأصحابه وسلم**

**والحمد لله رب العالمين**

## محتويات الكتاب

التوحيد والشرك

وجوب طلب العلم

الأمر بالمعروف النهي عن المنكر

بر الوالدين

حقوق الجار

## මෙම පොත තුල

තව්හීද් සහ ෂිර්ක්

අධ්‍යාපනය

අණකිරීම් සහ වළකීම

දෙමාපියන් හට උවටැන්

අසල්වාසීන්ගේ අයිතිවාසිකම්

للمساهمة في طباعة الكتاب

شركة الراجحي - ٢٠٤٠١٠٩٠٩٢

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بحي الروضة بالرياض
تحت إشراف وزارة الشئون الإسلامية والأوقاف والدعوة والإرشاد
هاتف ٤٤٩٧٧٧٧ فاكس ٤٤٠٧٧٧٦ البريد الإلكتروني mrawdhah@hotmail.com ص.ب ٨٧٢٩٩ الرياض ١١٦٤٢
ردمك: ٨-٨٦-٨١٣-٩٩٦٠